ISBN 1391-0418

# ගොවි ජනතා

22 වෙළුම     03-04 කලාප     2020 ජූලි - දෙසැම්බර්



කෘෂිකර්ම අමාත්‍යාංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

මිල රු.100/-

# ගොවි ජනතා

22 වෙළුම 03-04 කලාප 2020 ජූලි - දෙසැම්බර්

**ප්‍රධාන සංස්කාරක**
ජ්‍යොෂ්ඨ මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා

**සංස්කාරක මණ්ඩලය**
එච්.එම්.ජේ.කේ. හේරත්
එම්.ඩී. සුසිලා ලූර්දු
ඩබ්.ඒ. නාලක විජේසූරිය

**අධීක්ෂණය**
එස්.ඒ.සී.යූ. සේනානායක

**සංස්කාරක**
ඩී.එම්. අසංකා ඉන්දීවරී දිසානායක

**පිටු සැකසුම හා නිර්මාණය**
ඒ.පී. උදේනි කරුණාරත්න

**ප්‍රකාශන ඒකකය**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ 07.

| | |
|---|---|
| දුරකතන | 0112696981, 0112698540-41 |
| දිගුව | 320 |
| ෆැක්ස් | 0112691360, 0112692423 |



# ප්‍රධාන සංස්කාරක සටහන



**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා**

**අධ්‍යක්ෂ,**
**ප්‍රධාන විධායක නිලධාරී**

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

ශ්‍රී ලාංකීය කෘෂිකර්මාන්තයේ උන්නතිය උදෙසා කලින් කලට තේරී පත්වන රජයන් සහ රාජ්‍ය ප්‍රතිපත්ති විවිධ අයුරින් ක්‍රියාත්මක වී ඇත. එසේම 2020 දී “සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ” ද ලාංකීය කෘෂිකර්මාන්තය රසායනික කෘෂිකර්මාන්තයෙන් මිදී තිරසාර කෘෂිකර්මාන්තයක් සමඟ බද්ධ විය යුතුය යන අදහස දැඩිව ගැබ් ව තිබේ. ඒ අනුව රටේ කෘෂිකර්මාන්තය සොබාදහම සමඟ තුලිත කෘෂිකර්මාන්තයක් බවට පත් කිරීම සඳහා දැනට පවතින රජය විවිධ වැඩසටහන් ද ක්‍රියාත්මක කොට පවතී.

ලොවක් වසා පැතිර පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ජනතාව තම ආහාර සරිකර ගැනීම සඳහා විවිධ අයුරින් වගාවන් සඳහා යොමු වී ඇත. එය නිරෝගී ජනතාවක් බිහි වීමේ ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස ද අර්ථ දැක්විය හැකිය. කෙසේ වුව ද එය පවතින වසංගත තත්ත්වය හමුවේ සිදු වූ වාසි සහගතම ඵලදායී ප්‍රතිඵලය ලෙස ද සඳහන් කළ හැකිය.

ලාංකීය කෘෂිකර්මාන්තයේ පවතින විවිධ ගැටලු සඳහා පවතින රාජ්‍ය නායකත්වය විවිධ වූ සුබ ඵලදායි විසඳුම් ලබා දෙමින් තම භූමියේ කෘෂිකාර්මික ඉලක්කයන් වෙත ලඟා වෙමින් සිටියි. ගොවියන් හට ඇති ගැටලු ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ දී ඇති වන ගැටලු පිළිබඳ මේ වන විට රජය අවධානය යොමු කොට ඇත. එසේම කෘෂි යන්ත්‍රෝපකරණ ගොවිජන මධ්‍යස්ථාන හරහා පහසු ක්‍රමවේදයකට ගොවියන් හට ලබා දීමට ද මේ වන විට කටයුතු දියත් කොට ඇත. ඒ සඳහා “Smart Shops” නමින් ක්‍රමවේදයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ආරම්භ කොට ඇත. ඒ අනුව අවශ්‍ය කෘෂිකාර්මික තාක්ෂණය ගමට ලබාදීම තුළ තිරසාර කෘෂිකර්මාන්තයක් කරා මංපෙත් විවර වේ.

මෙකී සියලු ප්‍රයත්නයන් දරමින් වඩා යහපත් කෘෂිකාර්මික දේශයක නිරෝගී පරපුරක් රටට දායාද කිරීමට අපි සියලු දෙනා හට ඇති පරම පවිත්‍ර වගකීම නොපිරිහෙලා ඉටු කිරීමට එක් සිත්ව පෙළගැසෙමු.

# පටුන



සාර්ථක තිරසර ගෙවතු වගාවක්
08



වස විසෙන් තොර අපේ ගෙවත්ත
13



ගොවිජනතා අභියෝග පිළිබඳ කතිකාවත
19



බඩ ඉරිඟු බෝග වගාවේ මෑත කාලීන ප්‍රවණතා
23



කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය තුළින් ආර්ථිකය ගොඩනගමු
28



ආහාර ගබඩාකරණයේ දී හානිකරන කුරුමිණියන්
31



ලෝක ආහාර දිනය
34

# දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමන්ගේ 37 වෙනි අනුස්මරණය





දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමන්ගේ 37 වෙනි අනුස්මරණ උත්සවය සැප්තැම්බර් මස 18 වෙනි දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී පවත්වන ලදී.

මේ අවස්ථාවට ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා, වෙළෙඳ අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා, වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස් ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා, ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍ය නීතිඥ අනුරාධ ජයරත්න මැතිතුමා, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) සුමේධ පෙරේරා මහතා, හෙක්ටර්කොබ්බෑකඩුව මැතිතුමාගේ පවුලේ සමීපතයින්, අමාත්‍යාංශ ලේකම්වරු, රාජ්‍ය ආයතන ප්‍රධානීහු, රාජ්‍ය නිලධාරීන් මෙන්ම විද්වත්හු රැසක් සහභාගී විය.

දිවංගත කොබ්බෑකඩුව ඇමතිතුමාගේ කෘෂිකර්ම සහ ඉඩම් ප්‍රතිපත්තිය නව රජයේ "සෞභාග්‍යයේ දැක්ම" වැඩසටහන සමඟ අනුබද්ධ කරගත හැකි අයුරු පිළිබඳ මුඛ්‍ය දේශනය ජනාධිපති මාධ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් මොහාන් සමරනායක මහතා විසින් සිදු කරන ලදී. එකී දේශනය පහත පරිදි උපුටා දැක්විය හැකිය.

මෙම දේශනයෙහි දේශනය කිරීම පිළිබඳ අවධානම් සහගත කරුණු දෙකක් පවතිනවා. ඉන් එකක් වන්නේ හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමාගේ ආර්ථික, දේශපාලනික, කෘෂිකාර්මික ප්‍රතිපත්ති, ක්‍රියාමාර්ගය වත්මන් සමාජයේ දෘෂ්ටිවාදය අනුව පළල් පිළිගැනීමකට ලක් නොවීම. ඇතැම් අය එය යල් පැනගිය දර්ශනයක් යැයි අර්ථකථනය කරන ලදී.

නමුත් දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු සමාජය පාලනය කළ යුත්තේ කෙසේ ද යන්න ගැන විශාල සංවාදයක් ඇති විය. මෙකී සංවාදයේ දී මතු වුණු ප්‍රධාන අදහසක් වූයේ සමාජය පාලනය කළ යුත්තේ වෙළෙඳපොළ විසින් නොව සමාජය විසින් වෙළෙඳපොළ පාලනය කළ යුතුය යන අදහසයි. මේ අදහස ගැබ් කොට ගෙන කාල් පොලනී නැමැති ඕස්ට්‍රියානු ආර්ථික විද්‍යාඥයා විසින් විශිෂ්ඨ ග්‍රන්ථයක් සම්පාදනය කරන ලදී. එය The great transformation නමින් හැඳින්විය. සමාජය පාලනය කිරීම වෙළෙඳපොළට ඉඩ දුනහොත් සමාජය විනාශ වන බව එතුමා ප්‍රකාශ කළා. නමුත් එදා සමාජය තුළ සෑම දෙනාගේම පිළිගැනීමට ලක් වුණු මෙම මතවාදය පසුකලක දී යටපත් වී වෙළෙඳපොළ විසින් සමාජය පාලනය කළ යුතුයි යන දර්ශනය වර්තමානයේ නව ලිබරල් ආර්ථික මාදිලිය ලෙස ප්‍රකටව ඇත්තේ එයයි.

මනුෂ්‍යයාගේ අවාසනාවකට ලොව පුරා කොරෝනා අර්බුදය ඇති වුණා. ඒ තුළින් 1940 ගණන් වල මතු වුණු සමාජය විසින් වෙළෙඳපොළ පාලනය කළ යුතුය යන අදහස නැවතත් ඉස්මතුවෙමින් පවතියි. නමුත් තවම එය ගැඹුරින් කිඳා බැසගෙන නොමැත. එය තවත් එක් අවදානමක් ලෙස හැඳින්විය හැකියි. එක්සත් ජාතීන්ගේ මහලේකම් අන්තෝනියෝ ගුතේරස් 2020 ජූලි 18 කොරෝනා අර්බුදය උච්ච අවස්ථාවට පැමිණි සමයේ දී Twitter සටහනක් තබන ලදී. එය මෙසේය.

"සියලු දෙනාට සෞඛ්‍යය සහතික කරන්න වෙළෙඳපොළට පුළුවන් යන මුසාව covid 19 විසින් නිශේධනය කර ඇත. එසේම සමාජ සේවයෙන් එලක් නැත යන ප්‍රබන්ධය ද නිශේධනය කර ඇත".

එය ලංකාවේ දී පැහැදිලි වුණු කරුණක් ලෙස හැඳින්විය හැකිය. Covid 19 අර්බුද්යේ දී ශ්‍රී ලාංකීය වෛද්‍යවරු, සෞඛ්‍ය සේවා, දේශපාලන නායකත්වය එකමුතුව ක්‍රියා කළහ. ඒ පිළිබඳ විවේචන පැවැතිය ද එකී අර්බුදය විසඳීමට සියලු නිලධාරීන් යුහුසුළු වූහ. තමාට විය හැකි ආපදා හෝ නොසිතා එකී පිරිස සමාජ සේවය උදෙසා කැප විය. නමුත් වෙළෙඳපොළ දර්ශනය උගන්වන්නේ එය එසේ නොවන බවයි. එසේම ගුතේරස් තව කරුණක් පිළිබඳ සටහනක් තබන ලදී. එනම් අපි ජීවත් වෙන්නේ වර්ගවාදයෙන් තොර ලෝකයක යන කාරණය covid 19



විසින් නිශේධනය කර ඇති බව ද සඳහන් කරයි. අවසානයේ දී ඔහු ප්‍රකාශ කරනුයේ අපි හැමෝම ඉන්නේ එකම මුහුදක, ඇතැම් අය ඉන්නේ සුපිරි යාත්‍රා වල, අනිත් අය මුහුදේ පාවෙන සුන්බුන් වල එල්ලිලා ඉන්නවා ලෙසය.

ඒ අනුව දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමාගේ කෘෂිකර්ම සහ ඉඩම් ප්‍රතිපත්තිය නව රජයේ සෞභාග්‍යයේ දැක්ම වැඩසටහන සමඟ බද්ධ වන ආකාරය පිළිබඳව මා සාකච්ඡා කරන්නේ මෙවන් දෘෂ්ඨියක පිහිටා සිටය.

**කොබ්බෑකඩුව මැතිතුමාගේ දේශපාලන දෘෂ්ඨිය**

කොබ්බෑකඩුව මැතිතුමාගේ දේශපාලන ජීවිතයේ දී ඉඩම්, කෘෂිකර්ම, බෝග වගාව යනාදි ක්ෂේත්‍ර වල අනුගමනය කළ ප්‍රතිපත්තිය කොතරම් යථාර්ථවාදී, ජනතා හිතවාදී යන්න මෙහි දී විමසා බැලිය යුතුයි. 1947 දී ගරු අමාත්‍ය ටී.බී. ඉලංගරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති මහනුවර සමාජවාදී පෙරමුණේ සාමාජිකත්වය ගැනීම කොබ්බෑකඩුව මැතිතුමාගේ සමාජවාදී චින්තනයට තෝ තැන්නක් විය. 1960 -70 ගණන් වල "අධිරාජ්‍යවාදයට විනාශය ජනතාවට සමාජවාදය" යනුවෙන් පැමිණි කණ්ඩායම් වර්තමානය වන විට ප්‍රකාශ කරනුයේ සමාජවාදයට විලිරුදාවක් නැති බවයි. එවැනි අවධියක් වර්තමානය වන විට ගොඩ නැගී ඇත.

කොබ්බෑකඩුව මැතිතුමන් තමන්ගේ දර්ශනය පදනම් කරගනු ලබන්නේ සමාජවාදයෙන්. එයින් අදහස් වෙන්නේ මිනිසාට සතුටින්, තෘප්තියෙන් ජීවත් විය හැකි යහපත් සාධාරණ සමාජයක් ගොඩනැගීමයි. මිනිස් ජීවිතයේ මූලිකම පරමාර්ථය සතුටින් සිටීමයි. එය බුදුන් වහන්සේ පවා දේශනය කොට ඇත. බටහිර චින්තකයින් ද එය අනුමත කරයි. 1776 ජූලි 04 වෙනි දා ඇමරිකාවේ පිලඩෙල්පියා ප්‍රාන්තයේ දී සම්මත කරගත් ඇමරිකානු නිදහස් ප්‍රකාශනය විශිෂ්ඨ ලියවිල්ලකි. එහි දෙවන ඡේදයේ සඳහන් වෙන්නේ මිනිසාගේ මැවුම්කරුවා විසින් මිනිසාට පැහැර ගත නොහැකි අයිතිවාසිකම් කිහිපයක් ප්‍රදානය කර ඇති බවයි. එය වෙනත් අයෙකුට පැහැර ගත නොහැකියි. ඒවා නම් ජීවත් වීමට ඇති අයිතිය/නිදහස/සතුට සොයා යාමේ අවස්ථාව යනාදියයි. නමුත් එකී අරමුණු සපුරා ගැනීමට මිනිසාට ප්‍රමාණවත් තරම් පෝෂ්‍යදායක ආහාර ලැබිය යුතුයි. රෝගී වූ විට බෙහෙත් ගැනීමට අවස්ථාව තිබිය යුතු යි. නිදහස් පාලන තන්ත්‍රයක් යටතේ ජීවත් වීමේ අවස්ථාව තිබිය යුතු යි. එසේ ම ජීවිතේ අවසාන භාගයේ දී කිසිවෙකුට අත නොපා ජීවත් වීමට හැකි සමාජ ආරක්ෂණ ක්‍රමයක් තිබිය යුතු යි. අප සාධාරණ සමාජයක් යැයි අර්ථකථනය කරන්නේ එවැනි සමාජ තලයකටය.

2015 දී සාධාරණ සමාජයක් සඳහා ව්‍යාපාරය බිහි වන අතර ලෝකයේ ඇති ප්‍රධාන ප්‍රශ්නය ලෙස ඔවුන් සඳහන් කළේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමයි. නමුත් එහි දී මිනිසුන්ට ප්‍රමාණවත් ආහාර ලැබෙනවා ද? ගොවීන්ට වගාවන් සඳහා ප්‍රමාණවත් ජලය තිබෙනවාද? පොහොර ලැබෙනවා ද? ඔවුන්ගේ අස්වැන්න විකුණගන්න අවශ්‍ය පහසුකම් තියෙනවා ද? ඔවුන් අතර තිබෙන මන්ද පෝෂණය දුරු කරන්නේ කෙසේ ද? යන්න

සාධාරණ සමාජයට විෂය නොවුණි. පසුගිය මහ මැතිවරණයට පෙර අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් ලංකාව පුරා සංචාරය කළ අතර ඒ සෑම අවස්ථාවක දීම මිනිසුන්ගේ අවශ්‍යතා සඳහා සවන් යොමු කරන ලදී. එහි දී ජනතාව පැවසුවේ නිරවුල් ඉඩම් දෙන්න. පොහොර දෙන්න, දරුවන්ට පාසැල් දෙන්න, පාසැල් වලට ගුරුවරු දෙන්න, ගමට රෝහල් දෙන්න, වෛද්‍යවරු දෙන්න යනාදියයි. ඒ අනුව ජනාධිපතිතුමා/රාජ්‍ය අමාත්‍යාංශ නිර්මාණය කරන ලදී. එතැන් ගැබ් වී ඇත්තේ හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමාගේ ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිපත්තියේ දිගුවක් බවට පැහැදිලි වේ.

සාධාරණ සමාජයක් ගොඩනැගීමට නම් ඉඩම් අයිතිය ඉඩම් පරිහරණය, බෝග වගාව, ඵලදායිතාව, නඩත්තුව, නිෂ්පාදන බෙදා හැරීම, ගොවියාගේ පෝෂණය කේන්ද්‍රිය සාධක ලෙස ඉතිහාසය පුරාම දක්නට ලැබේ. ගෝත්‍රික සමාජයේ ගෝත්‍ර අතර සටන් සිදු වූයේ ද, යටත් විජිත අධිරාජ්‍යයේ විවිධ ගැටුම් ඇති වූයේ ද ඉඩම් මුල් කරගෙනය. 1917 රුසියානු විප්ලවයේ දී මිනිසුන් රුසියාවේ පෙළපාලි සංවිධානය කළ අතර ඔවුන් ප්‍රකාශ කළේ බලය සෝවියට් සභා වලට ඉඩම් ජනතාවට යනාදී ලෙසය. සෝවියට් විප්ලවය අසාර්ථක වූ නමුත් එම විප්ලවීය ඉල්ලීම් නිරර්ථක යැයි ප්‍රකාශ කළ නොහැක. ඉඩම් ඒ තරමම කේන්ද්‍රීය සාධකයකි.

වර්තමානයේ ද වෙන යම් ස්වරූපයකින් ලෝක පරිමාණ ඉඩම් කොල්ලයක් ගොවියාට සිදු වෙමින් පවතියි. අප රටටත් වඩා අප්‍රිකානු මහද්වීපයේ ලතින් ඇමරිකාවේ ද ඉඩම් කොල්ලයන් පවතියි. ගොවියාට ඉඩම් අයිතිය අවශ්‍ය බව හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා අවබෝධ කරගෙන සිටියේය. 1970 බණ්ඩාරණායක මැතිනියගේ ඉඩම් හා කෘෂිකර්ම අමාත්‍යවරයා වශයෙන් පත් වූ විට එතුමා එය ක්‍රියාවට නැංවූයේ දුර දක්නා නුවණින් ගැඹුරු ලෙස සිතා බලාය. එයින් වර්තමානයේ දී අපි විශාල ප්‍රයෝජන ගනිමින් සිටින්නෙමු.

2001 දෙසැම්බර් මාසයේ බලට පත් ආණ්ඩුවේ අගමැතිවරයා ප්‍රකාශ කළේ කුඹුරු ඉඩම් ගොඩ කර ගර්කින් වගා කරන ලෙසය. ඒවා යුරෝපයට ආනයනය කොට මුදල් ලබාගත හැකි බව ඔහු ප්‍රකාශ කරන ලදී. එසේම 2015 යහපාලනය ආණ්ඩුවේ කෘෂිකර්ම ඇමතිවරයා ප්‍රකාශ කළේ ද රටේ වී නිෂ්පාදනය වැඩියි. එම වී ප්‍රමාණය අඩු කරන්න නම් වී වගා කරන ප්‍රමාණය අඩු කළ යුතු බවයි. එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළේ නම් කොරෝනා උවදුර අවස්ථාවේ මෙරට මිනිසුන් හට සිදු වන්නේ කුමන තත්ත්වයක් ද?

1956 දී බණ්ඩාරනායක මැතිතුමා පටන් ගත් කෘෂිකාර්මික ගමන් මග 1970 දී කොබ්බෑකඩුව මැතිතුමා වඩා පුළුල්ව ඉදිරියට ගෙන යන ලදී. නිශ්චිත ඉඩම් කෘෂිකර්ම ප්‍රතිපත්තියක නිර්මාතෘ ලෙස ද එය ක්‍රියාත්මක කළ දේශපාලන චරිතය ලෙස ද හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා අපට හඳුනා ගත හැකිය.

ඉඩම් මනුෂ්‍යයාගේ ජීවිතයේ ඓන්ද්‍රීය සාධකයකි. ඉහළ සංවර්ධනයක් අත්පත් කර ගත් සෑම අවස්ථාවකදීම ඉඩම් ප්‍රධාන සාධකයක් බවට පත් වී ඇත. ධනේශ්වර නිෂ්පාදන මාදිලියේ පදනම නිර්මාණය වන්නේ ජනතාව භූමියෙන් ඈත් කිරීමයි. බ්‍රිතාන්‍යයේ ලංකාවේ මුඩු බිම් පනත සම්මත කරගතතේ ද ඔවුන්ගේ රටේ එය දියත් කළේ ද එම නිසාය. මේ කරුණ කොබ්බෑකඩුව මැතිතුමාගේ ඉඩම් හා කෘෂිකර්ම ආහාර හා ප්‍රතිපත්ති වල කේන්ද්‍රීය ලක්ෂණයක් විය. එහි ප්‍රතිඵල වර්තමානය වන විට ද අපි භුක්ති විඳින්නෙමු. ඉඩම් අයිති විය යුත්තේ ඉඩම් වගා කරන අයටමය. බර්ටෝල්බ්‍රෙෂ්ට්ගේ නාට්‍යයක ගොවි දන මනා වූ දිනිය යුතු වූ සේම ගම් බිම් ලෙස සඳහන් වන්නේ ද එම නිසාය. ඉඩම් අයිතිය තිබිය යුත්තේ මෙරට ජනතාවට මිස විදේශකයින්ට නොවේ. මෙම ඉඩම් නිසි ක්‍රමවේදයකට අනුව වගා කළ යුතුය. ඒ සඳහා ආයතන පද්ධතියක් තිබිය යුතුය. නිදසුනක් ලෙස හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ අයාතනය හැඳින්විය හැකිය. මෙම ආයතනය එක්තරා යුගයක දී අපේ රටේ ආහාර නිෂ්පාදනයට, බෝග වගාවන්ට, සුළු අපනයන බෝග සඳහා, කුළු බඩු ආදිය පිළිබඳව ද විවිධ පර්යේෂණ සිදු කළ අතර ඒවා විශාල මෙහෙවරක් රටට සිදු කළේය. කෘෂිකාර්මික සංවර්දනය සඳහා එවැනි ආයතන පද්ධතියක් තිබිය යුතුය. ව්‍යාප්ති සේවා තිබිය යුතිය. ඒ අනුව ගොවි ජන සේවා දෙපාර්තමේන්තු ආරම්භ විය. ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කෘෂකර්ම ප්‍රතිපත්ති බණ්ඩාරණායක මහතාගේ ආණ්ඩුව, බණ්ඩාරනායකමැතිණියගේ ආණ්ඩුව සහ ඒ ආණ්ඩුවේ කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍යවරයාව සිටි හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ දර්ශනය මෙරට කෘෂිකර්මාන්තයේ ප්‍රගමනය සඳහා ඉවහල් විය. වර්තමානයේ දී නැවත වරක් ජනතාවට ඉඩම්, පෝෂණය, ජනවාට සෞඛ්‍යය යන ප්‍රතිපත්ති පදනම් වූ ආණ්ඩුවක් බිහි වී ඇත.

**සෞභාගයේ දැක්ම සහ කොබ්බෑකඩුව මැතිතුමාගේ ආර්ථික දර්ශනය**

දේශීය ආර්ථිකයක් ආහාර සුරක්ෂිතාව මත පදනම් වූ මනුෂ්‍ය පැවැත්මෙහි අත්‍යවශ්‍ය සාධකයක් ලෙස සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ පැහැදිලිව දක්වා ඇත. සියලු සත්වයෝ ආහාරයෙන් යැපෙන බව බුදුන් වහන්සේ ද වරක් දේශනා කොට ඇත. 1997 එක්සත් ජාතීන්ගේ රාජ්‍ය නායකයින් සහභාගි වූ සමුළුවේ දී ආහාර මනුෂ්‍ය අයිතියක් ලෙස පිළිගත්තේය. ඒ අනුව ආහාර සුරක්ෂිතතාවය සහතික වන දේශීය ආර්ථිකයක්, එකී දේශීය ආර්ථික ශක්තිමත් කරන කෘෂිකර්මාන්ත ආශයක් නිර්මාණය කිරීම සෞභාගොයය් දැක්ම තුළ අන්තර්ගත වී ඇති ප්‍රධාන කරුණකි. සෞභාග්‍යයේ දැක්මෙහි පස්වෙනි කොටසේ ජනතා කේන්ද්‍රීය ආර්ථිකය නැමැති ජේදයේ එකී සෞභාග්‍යයේ කරුණු දැක්වේ. ඒ තුළින් වත්මන් ආණ්ඩුවේ අපේක්ෂිත කෘෂිකර්මාන්ත සංවර්ධන ප්‍රතිපත්ති පැහැදිලිව දැක්වේ. එකී කරුණු පදනම ්කරගෙන කෘෂිකර්මාන්තයට



එක් අමාත්‍යවරයෙක් සහ කෘෂිකර්මයට රාජ්‍ය අමාත්‍යවරු තිදෙනෙක් පත කරන ලදී. ඒ අනුව කෘෂිකර්මාන්තයේ එක් සුළු අංශයකට පවා රටේ ජනාධිපතිතුමා විසින් අර්ථවත් දැක්මක් සහිත වැඩපිළිවෙලක් ක්‍රියත්මක කරමින් පවතියි.

ලෝකයේ සංවර්ධනය වූ රටවල් එම ස්ථානය කරා ගමන් කළේ කෙසේ ද යන්න සොයා බැලීම මෙහි දී වැදගත් වේ. අපිට උගන්වන මාදිලියේ දී ප්‍රකාශ කරන්නෙ ්ආර්ථිකය විවෘත කරන්න, පිටරටින් පැමිණෙන ප්‍රාග්ධනයට ඉඩ දෙන්න. නමුත් සංවර්ධනය වූ රටවල් එකී ස්ථානයකට පිවිසියේ එලෙස ගමන් කළ ගමන් මගෙහි නොවේ. කේම්බ්‍රිජ් සරසවියෙහි මහාචාර්යවරයෙකු වූ Ha-joon Chang “kicking away” the ladder – Development strategy in Historical perspective යන ග්‍රන්ථයෙහි සඳහන් වෙන්නේ ධනවත් වූ රටවල් තමන් ධවත් වීම සඳහා උඩට නැගුණු ඉනිමග වීසි කරන්න යනුවෙන් අපට ප්‍රකාශ කරයි. නමුත් ඔවුන් ධනවත් වූයේ අපට ප්‍රතික්ෂේප කරන්න යැයි ප්‍රකාශ කළ මාදිලිය ඔස්සේය. නිදසුනක් ලෙස ඇමරිකානු එක්සත් ජනපදය 2020 ජුනි මාසයේ අග වන විට ඇමරිකානු ආර්ථිකයේ වටිනාකම ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 24ක් ලෙස සඳහන් විය. ඒ අනුව ඇමරිකාව ලොව අංක එකේ ආර්ථිකබලය සහ මිලිටරි බලය හිමි රාජ්‍යයයි. එම රාජ්‍යයෙහි ජනාධිපති ඇතුළු පාලක මණ්ඩලය තීරණය කළහොත් මේ පෘථිවිය මත තිබෙන ශිෂ්ටාචාරය මාසයක් ඇතුලත සුන්බුන් ගොඩක් බවට පත් කරන්නට හැකියාවක් ඇත.

එකී රටවල් එම ස්ථානයට පැමිණියේ කෙසේ ද? 19 වන සියවසේ දී එක්සත් ජනපදයේ තමන් අනුගමනය කළ යුතු මාදිලිය පිළිබඳ විවාදයක් පැවතුණි. එකල බ්‍රිතාන්‍ය ශක්තිමත් ස්ථානයක් දිනා සිටියේය. මේ විවාදයේ දී 1862 සිට අවුරුදු 06ක් රට පාලනය කළ ජනාධිපතිවරයා වූ ඒබ්‍රහම් ලින්කන් මෙලෙස ප්‍රකාශ කරන ලදී.

“මම බදු ගැන එච්චර දන්න මිනිහෙක් නෙමෙයි. නමුත් මම වෙනත් දෙයක් දන්නවා. අපි පිටරටින් භාණ්ඩ මිල දී ගත්තොත් අපිට භාණ්ඩය එනවා. පිටරටට සල්ලි යනවා. අපි භාණ්ඩ මේ රටේ හැදුවොත් භාණ්ඩයත් අපේ සල්ලි අපේ”

මේ අයුරින් ඔවුන් සංවර්ධනය කරා පිය නගා ඇත.

රොනල්ඩ් රේගන් ජනාධිපතිවරයාගේ සමයේ දී නිදහස් වෙළෙඳාම (Free trade) පිළිබඳ ලෝකයටම දේශනා පැවැත්විය. ඔහුගේ පාලන සමයේ දී ඇමරිකානු ඉතිහාසයේ ආරක්ෂණවාදී ප්‍රතිපත්ති දැඩිව අනුමනය කළේය. ප්‍රසිද්ධියේ එකී දර්ශනය ප්‍රතික්ෂේප නොකළත් තමන්ගේ රටේ ඇති සම්පත් විභවතා හඳුනාගෙන ඒවා තුළින් නිසි ප්‍රෙයා්ජන රැගෙන ශක්තිමත් දේශීය ආර්ථිකයක්, ආහාර සුරක්ෂිතතාව විසින් සළකුණු වූ මං පෙතක් ගොඩනැගීම සෞභාග්‍යයේ දැක්මෙහි

අභිප්‍රාය වී ඇත. ඒ සඳහා වූ වැඩපිළිවෙල වර්තමානයේ දී ක්‍රියාත්මක වෙමින් පවතියි. එම නිසා බඩ ඉරිඟු වලට වෙනත් ධාන්‍ය වලට විෂයටම නම ඇතුලත් කොට රාජ්‍ය අමාත්‍යවරුන් එක් එක් විෂය මාලාවන් පත් කොට ඇත. මෙම දර්ශනය සාක්ෂාත් කර ගැනීම සඳහා ජනතාවගේ නොමද සහය අවශ්‍යව පවතියි.

ඔවුන්ගේ ඉඩම් කොල්ලය අතිශය කුරිරු අමානුෂික ආසාධාරණයකි. ඒ නිසා එකී සමාජය තුළ පීඩනයක් නිර්මාණය විය. වර්තමානය වන විට ද මුළුමනින්ම එය අහෝසි වී නොමැත. ඒ නිසා ඉඩම් ජනතාවට ආහාර ජනතාවට පෝෂණය යන ප්‍රතිපත්ති පදනම් කර ගනිමින් සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය ගොඩ නැගී ඇත. ඒ අනුව මේ සියලු කරුණු තුළින් ගම්‍යමාන වනුයේ හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමාගේ දර්ශනය සහ සෞභාග්‍යයේ දැක්ම අතර පවතින්නේ අවියෝජනීය සම්බන්ධතාවය ඇති බවයි. එකී සම්බන්ධතාවය රැක ගනිමින් අපේ රට ශක්තිමත් දේශයක් බවට පත් කිරීමේ ප්‍රයත්නය අතිශයින් සාර්ථක වේවායි අපි පතමු.



**මොහාන් සමරනායක**

**ජනාධිපති මාධ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්**

**ජනාධිපති මාධ්‍ය ඒකකය**



# සාර්ථක තිරසාර ගෙවතු වගාවක්




**දිලූපා බමුණුආරච්චි**

ජ්‍යෝෂ්ඨ පර්යේෂණ නිලධාරිනී

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය




කෘෂිකර්මය සහ ආහාර සුරක්ෂිතතාව වර්තමානය වන විට පෙර නොවූ විරූ තරම් ශ්‍රී ලංකාව තුළ පමණක් නොව මුළු මහත් ලෝකය තුළ ම අතිමහත් අවධානයට ලක් වූ ක්ෂේත්‍රයකි. පවතින Covid – 19 වසංගත තත්ත්වය සමඟ ආහාර අගයදාමවල පැවැත්ම කෙරෙහි අතිමහත් බලපෑමක් සිදුව ඇති අතර ගෝලීයකරණයෙන් ඔබ්බට ගිය ආහාර සුරක්ෂිතාවයක් කෙරෙහි අවධානය යොමු කිරීමට බොහෝ රටවලට සිදුව ඇත.

කෘෂිකර්මය සහ ආහාර සුරක්ෂිතතාව වර්තමානය වන විට පෙර නොවූ විරූ තරම් ශ්‍රී ලංකාව තුළ පමණක් නොව මුළු මහත් ලෝකය තුළ ම අතිමහත් අවධානයට ලක් වූ ක්ෂේත්‍රයකි. පවතින Covid – 19 වසංගත තත්ත්වය සමඟ ආහාර අගයදාමවල පැවැත්ම කෙරෙහි අතිමහත් බලපෑමක් සිදුව ඇති අතර ගෝලීයකරණයෙන් ඔබ්බට ගිය ආහාර සුරක්ෂිතාවයක් කෙරෙහි අවධානය යොමු කිරීමට බොහෝ රටවලට සිදුව ඇත. එසේම රටෙහි ජනතාවගේ ඉදිරි ආහාර අවශ්‍යතා සපුරා ගැනීමට ඒ ඒ රටවල් සතුව ඇති හැකියාව පිළිබඳ නැවත සිතීමට අවස්ථාව උදා වූ අතර ගෙවතු වගාව කෙරෙහි විශේෂ අවධානයක් ශ්‍රී ලංකාව තුළ ද ඇති විය.

කලින් කල විවිධ රජයන් යටතේ ගෙවතු වගා වැඩසටහන් ක්‍රියාත්මක වුව ද, මෙපමණ ප්‍රජා සහභාගීත්වයකින් ගෙවතු වගාවන් සිදු කළ අවස්ථාවන් හඳුනා ගැනීම අපහසු ය. “අපි වවමු - රට නගමු“ (2007) “දිවි නැගුම“ (2011) අවාරේ අහවරයි (2014) ආහාර නිෂ්පාදන වැඩසටහන (2016) අපි වවලයි අපි කන්නේ (2018), මෙලෙස ක්‍රියාත්මක වූ ගෙවතු වගා වැඩසටහන් වන අතර වර්තමානය වන විට සෞභාග්‍යා ගෙවත්ත (2020) යන ගෙවතු වගා වැඩසටහන දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලබයි. විවිධ රජයන් ඉහත සඳහන් විවිධ වැඩසටහන් මඟින් ගෙවතු වගාකරුවන්ට මූලිකව බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම සිදු කරන ලදී. එසේ වුව ද, පසුගිය වකවානුවල ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන් වල තිරසාර බව පිළිබඳ ගැටලු සහගත තත්ත්වයක් පවතින අතර මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී බලාපොරොත්තු වූ අරමුණු පරිපූර්ණව සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වීම පිළිබඳ අවධානය යොමු කළ යුතු ය. තව ද, ගෙවතු වගාකරුවන්ට නිවැරදි මඟ පෙන්වීමක් තුළින් මෙම ගෙවතු වගාවන්වල තිරසාර බව පවත්වාගෙන යෑමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම ද අත්‍යාවශයෙන් ම සිදු විය යුතු ය.

ගෙවතු වගාවන්වල මූලික බලාපොරොත්තුව ආහාර සුරක්ෂිතතාවය සහ වස විසෙන් තොර ආහාර කුටුම්භයට සපයා ගැනීම වන අතර එම අරමුණු තිරසාර ලෙස ඉෂ්ඨ කර ගැනීමට ගෙවත්තේ බෝග කිහිපයක් වගා කිරීමෙන් ඔබ්බට ගිය පහත කරුණු සලකා බැලීම වඩා ඵලදායි වනු නො අනුමාන ය.

**ගෙවතු වගාව හා කෘෂි සම්පත් කළමනාකරණය**

මෙහි දී කෘෂි සම්පත් ප්‍රශස්ථ ලෙස කළමනාකරණය කිරීම දැක්විය හැකි ය. වගාව සඳහා අවශ්‍ය බීජ/රෝපණ ද්‍රව්‍ය සහ පොහොරවලට අමතර ව භූමිය, ජලය, පස සහ හිරු එළිය වගාවක් සඳහා අවශ්‍ය ප්‍රධාන සාධක වේ.

**භූමිය**

නූතන නාගරික ගෙවතු වගාවේ ප්‍රධාන සීමාකාරී සාධකය වන්නේ භූමියයි. ගෙවතු වගාව නාගරික, අර්ධ නාගරික සහ ග්‍රාමීය ලෙස වර්ගීකරණය කළ හැකි ය. නාගරික හා අර්ධනාගරික ගෙවතු වගාවන්ගේ ප්‍රධාන සීමාකාරී සාධකය භූමිය වන අතර ඊට විසඳුමක් ලෙස වර්තමානයේ දී සිරස් අවකාශයේ වගා කිරීම සහ විවිධ ක්‍රමවේද අනුගමනය කරමින් වගා කිරීම සිදුකරනු ලබයි. උදාහරණ ලෙස බඳුගත වගාව, වගා රාක්ක, වගා කුළුණු, වගා කූඩාරම්, හරිත බිත්තිය වැනි ආකාර දැක්විය හැකිය.

**හිරු එළිය**

නාගරික ගෙවතු වගාව තුළ භූමියට සමාන්තර සීමාකාරී සාධකයක් ලෙස හිරු එළිය දැක්වීමට පුළුවන. ඉහත සඳහන් විවිධ වගා ක්‍රම භාවිතයෙන් ගෙවතු වගාකරුවන් තම වපසරියට ලැබෙන හිරු එළිය ප්‍රශස්ත ලෙස භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගැනීම සිදු කළ යුතු ය. මෙයට අමතර ව බෝග විවිධාංගීකරණය මඟින් මෙන් ම උචිත බෝග අදාළ ස්ථානයේ වගා කිරීම මඟින් හිරු එළිය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමේ අවස්ථාව ලබාගත හැකි ය.

**පස**

පස යනු වර්තමානයේ නාගරික වගාව තුළ ඉතාමත් සීමා සහිත සම්පතකි. බොහෝ විට නාගරික ප්‍රදේශවල පස් නොමැතිකම නිසා ස්වාභාවික පස තුළ වගා කිරීමට අවස්ථාවක් නො ලැබේ. ඊට පිළියම් ලෙස බඳුන්ගත ක්‍රමය භාවිතයෙන් උඩු මහල්, සඳළුතල සහ කොන්ක්‍රීට් ඇතිරූ පොළොව මත බාධාවකින් තොරව ගෙවතු වගාවේ නියැළීමට නාගරික වැසියන්ට ද හැකියාව ලැබී තිබේ. මෙහි දී, කොහුබත් ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදනයක් වන කොකොපීට් (Coco peat) සහිත වගා මළු භාවිතයෙන් බඳුන්ගත වගාව සිදු කළ හැකි ය. වර්තමානයේ තක්කාලි, වම්බටු, මිරිස් වැනි බෝග පමණක් නොව දඹල, කරවිල වැනි වැල් බෝග ද (සිරස් වගාව මඟින්), බතල වැනි අල බෝග ද, නාරං, දොඩම්, අඹ පේර, උගුරැස්ස වැනි පලතුරු බෝග ද බඳුන්ගත වගාව තුළ සිදු කරන අතර ම නිසි නඩත්තුව මඟින් කෙටි කාලයකින් ම ප්‍රමාණවත් ඵලදාවක් ලබා ගැනීමට අවස්ථාව උදා කරගත හැකි වේ. සාර්ථක වගාවක් සඳහා සාරවත් පස අත්‍යාවශ්‍ය සාධකයක් වන අතර ගෙවතු වගාවේ දී කාබනික පොහොර යොදා ගැනීම අනිවාර්ය අංගයකි. වගා මාධ්‍ය ලෙස මතුපිට පස්, වැලි, කොම්පෝස්ට්, පිළිස්සූ දහයියා, කුඩාවට කැපූ පොල් ලෙලි හෝ කොහුබත්, ගොම පොහොර, කුකුල් පොහොර (විශේෂයෙන් බිත්තර දමන සතුන්ගේ බිම් ඇතිරුම) වැනි ද්‍රව්‍ය විවිධ බෝගවල විවිධ අවස්ථා සඳහා විවිධ අනුපාතවලින් යොදා ගන්නා අතර පවතින

දේශගුණය අනුව ද සංයුතිය වෙනස් කරයි. (උදා. වැසි අධික ප්‍රදේශවල කොහුබත් වෙනුවට කැපූ පොල් ලෙලි



සුදුසු ලෙස යොදයි). මෙහි දී පසේ සාරවත් බව පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර එය සාර්ථක වගාවක් සඳහා මනා පිටුවහලක් ලෙස සැලකිය හැකි ය.

**ජලය**

ජලය වගාව සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන අතර ගෙවතු වගාව තුළ විවිධ ක්‍රමවේද මඟින් ජල සංරක්ෂණය මෙන් ම වැසි තත්ත්ව වල දී වගාව රැකගැනීම සඳහා කටයුතු කළ යුතු ය. නිවසේ අපජලය (grey water) සුදුසු ක්‍රමවේද භාවිතයෙන් බෝග වගාව සඳහා යොදා ගැනීමේ අවස්ථාව සලසා ගත හැකි වේ. මෙයට අමතර ව අධික වැසි පවතින ස්ථාන වල අගල් භාවිතය, උස් ස්ථාන වල වගාව ඔස්සේ වැසි ජලය බැස යාමට සැලැස්වීම මඟින් පසේ සවිවර බව තහවුරු කිරීම සාර්ථක බෝග වගාවක් සඳහා අත්‍යාවශ්‍ය ය. අඩු වියදම් ආරක්ෂිත ගෘහ මඟින් වැසි ආවරණ ඇතිකර පාලිත තත්ත්ව යටතේ බෝග වගා කිරීමේ අවස්ථාව සලසා ගත හැකි ය.

**නිවසේ කසල ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ ගෙවතු වගාව**

ගෙවතු වගාව සඳහා අවැසි කාබනික පොහොර සැපයීම මුළුතැන්ගෙයින් ඉවත් කරන ලද කසළ භාවිතයෙන් කොම්පෝස්ට් ලෙස සහ දියර පොහොර ලෙස සාදා ගත හැකි ය. මේ සඳහා කොටස් කරන ලද කෙසෙල් ලෙලි මෙන් ම ග්ලිරිසිඩියා කොළ භාවිතා කිරීම, කතුරුමුරුංගා වැනි (*compositae*) කුලයේ පත්‍ර භාවිතා කළ හැකි ය. ඉහත සඳහන් ශාක පත්‍ර ජලය නිසි පරිමාවක් තුළ දින කිහිපයක් පල් වීමට හැරීමෙන් ලබා ගන්නා ද්‍රාවණය ශාක පෝෂකයක් මෙන් ම කෘමි විකර්ශකයක් ලෙස ද යොදා ගත හැකි අතර ම නිවසින් ඉවත් කරන ප්ලාස්ටික් බෝතල්, ටයර් ආදි විවිධ දේවල්

නොයෙකුත් ආකාරයෙන් ගෙවතු වගාවේ දී ප්‍රයෝජනයට ගත හැකි වේ. උදාහරණ ලෙස ඉවතලන ටයර් වලට පස් පුරවා ගොටුකොළ වැනි පලා වර්ග සහිත පලා කොටුවක් සකසා ගත හැකි අතර ඉවතලන ලද ප්ලාස්ටික් බෝතල් ආධාරයෙන් විවිධ වගා බඳුන් සකසා ගත හැකි ය. තව ද, මෙම බෝතල් විවිධ ආකාරයට සැකසීමෙන් වගාව සඳහා අඛණ්ඩ ජල වහනයක් ලබා දීමට හැකි ආකාරයට සකස් කළ යුතු ය. (උදා - මෙගා බෝතල් වල මූඩියේ සිහින් සිදුරක් ඇති කර ජලය පුරවා වගාබිමේ ආධාරකයක් ආධාරයෙන් ස්ථානගත කර බිංදු ජල සම්පාදනය සිදු කරන ආකාරයට සකසා ගත හැකි ය.) ඉවතලන වැහි පීලි ආශ්‍රයෙන් වගා රාක්ක සකසා ගැනීම මෙන් ම නිවසේ ඉවතලන පයිප්ප සහ වෙනත් දේවල් මඟින් වැල් බෝග සඳහා පන්දලම් මෙන් ම ආරක්ෂිත ගෘහ සකසා ගැනීමේ අවස්ථාව උදාකර ගත හැක. තව ද, පොල් ලෙලි භාවිතයෙන් පාත්ති සකස් කිරීම මෙන් ම ජල සංරක්ෂණය සිදු කළ හැකි වේ. ඉවතලන හාල්මලු භාවිතයෙන් විවිධ බෝග (විවිධ එළවළු වර්ග මෙන් ම බතල වැනි අල බෝග ඉතා පහසුවෙන් වගා කොට සාර්ථක අස්වැන්නක් ලබා ගත හැක.)

**ගෙවත්ත තුළ බෝග විවිධාංගීකරණය**

බෝග විවිධාංගීකරණය මඟින් ගෙවතු වගාවේ දී යහපත් ප්‍රතිඵල ලබා දෙනවා මෙන් ම තිරසාර වගාවක් ලෙස නඩත්තු කර ගැනීමේ හැකියාව ලැබේ. මේ සඳහා විශේෂයෙන් ම ගැළපෙන බෝග සංකලනයක් එකට වගා කළ යුතු ය. උදා - පන්දලමක්

සකස් කර එය ආධාරයෙන් කරවිල, පතෝල, පිපිඤ්ඤා, දිය ලබු, මෑ මෙන් ම වට්ටක්කා ද එකට වගා කර ගත හැකි වේ. මෙහි දී කුටුම්භයේ අවශ්‍යතාව නාගරික ගෙවතුවල මූලික අරමුණ බැවින් එක වර්ගයකින් වැල් කිහිපයක් පැවතීම ප්‍රමාණවත් වේ. මේ අතර ම පලා වර්ග සිටුවීමේ දී විවිධ පලා වර්ග එකට සිටු විය හැක. (උදා: ගොටුකොළ, සලාද, තම්පලා, මිංචි,කංකුං, මුකුණුවැන්න) මේ අතර ගෙවතු වගාව සඳහා බෝග පරතර නිර්දේශයන් බොහෝ විට යොදා නො ගන්න අතර ඉඩකඩ උපරිම ලෙස යොදා ගැනීම පමණක් සිදු කරයි. විවිධ ආකාරයට සිරස් වගා ක්ෂේත්‍ර සකස් කිරීම වර්තමානයේ දී නාගරික කෘෂිකර්මය තුළ සිදු කරන අතර හිරු එළිය උපරිම ලෙස ලබා ගත හැකි ආකාරයට බෝග වගා කිරීම සිදු කරයි. (උදා - පහළ ස්ථරවල කොළ බෝග වගාකරන අතර ඉහළම ස්ථරයේ මිරිස්, තක්කාලි, මාලු මිරිස්, කොව්පි වැනි බෝගයක් තනි බෝගයක් ලෙස සිටුවිය හැකිය. බෝග විවිධාංගීකරණය මගින් බෝගයනට වැළදෙන ලෙඩ රෝග අවම කිරීම ගෙවතු වගාවේ දී අත්වන තවත් වාසි සහගත තත්ත්වයක් වේ.

**දේශීය බෝග වගා කිරීම**

ගෙවතු වගාව විශේෂයෙන් ම කාබනික වගාවක් ලෙස සිදු කරන බැවින් හැකි සෑම විට ම දේශීය බෝග වගා කිරීමට යොමු විය යුතු ය. උදාහරණ ලෙස ඇත්දළ බණ්ඩක්කා, ලේන ඉරි වම්බටු, දේශීය දඹල, ගොරකා තක්කාලි, දේශීය අල වර්ග ආදිය දැක්විය හැක. දේශීය බෝග බොහෝවිට පවතින පාරිසරික තත්ත්ව සඳහා හැඩගැස්මක් ඇති අතර ම දෙමුහුම් ප්‍රභේද මෙන් පොහොර හා අනෙකුත් සාධක සඳහා අධි සංවේදීතාවයක් නොදක්වයි. එබැවින් පවතින තත්ත්ව තුළ ඉහළ සරු එලදාවක් ලබා දීමට මෙම දේශීය බෝගවලට අවස්ථාව සැලසේ.

**ක්‍රමවත් ව වගා කිරීම සඳහා වගාව නඩත්තුව**

සීමිත වපසරියක් තුළ නාගරික මෙන් ම අර්ධ නාගරික ගෙවතු වගාවන් සිදු කරන බැවින් වගාව ක්‍රමවත්ව පවත්වා ගැනීම අත්‍යවශ්‍ය කටයුත්තකි. එසේ ම, වර්තමානය වන විට උද්‍යාන අලංකරණයේ නවමු මානයක් ලෙස (Edible Landscoping) ගෙවතු වගාව යොදා ගනී. මෙහි දී එලින් බර වූ ගෙවත්තක් පැවතීම අත්‍යවශය වන අතර වගාව ඉතාමත් නිවැරදි ආකාරයට නඩත්තු කිරීම ඉතා වැදගත් වේ. විශේෂයෙන් ගෙවතු තුළ පලතුරු බඳුන්ගත ව වගා කිරීමේ දී කප්පාදුව ඉතා වැදගත් වේ. අනවශ්‍ය පත්‍ර ඉවත් කිරීම මගින් එම ශාක තුළ සංචිත ආහාර එල ලෙස ලබා ගැනීමේ අවස්ථාව සැලසේ . උදාහරණ ලෙස බඳුන් ගත දොඩම් ශාකයක් නඩත්තු කිරීමේ දී එහි දිය රිකිලි මෙන් ම අනවශ්‍ය අතු ඉවත් කිරීම අත්‍යවශ්‍ය ය. එසේ ම, ගස උස යාම පාලනය කළ යුතු අතර ගස තුළට හොඳින් හිරු එළිය වැටෙන ආකාරයට නඩත්තුව සිදු කිරීම එල බර ගසක් ලබා ගැනීමට ඉවහල් වේ. ඉහත ආකාරයට සියලුම බෝග, ඒ ඒ බෝගයට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශිත ආකාරයට නඩත්තු කිරීම තිරසාර ගෙවත්තක වැදගත් ම සාධකයයි.

**සාම්ප්‍රදායික රෝග හා පළිබෝධ පාලනය**

වස විසෙන් තොර ගෙවතු වගාවක් වෙනුවෙන් ගෙවත්ත රසායනික පළිබෝධ නාශකවලින් තොර විය යුතු ය. එබැවින්, ගෙවතු වගාව තුළ පළිබෝධ පාලනය සඳහා

විවිධ සාම්ප්‍රදායික ක්‍රම යොදා ගනු ලබයි. උදාහරණ ලෙස දාස් පෙතියා වැවීම, *citronella* හා *compositae* කුලයේ ශාක පත්‍ර දින කිහිපයක් පල් වන්නට හැර ලබාගන්නා නිස්සාරණය, කොහොඹ ඇට නිස්සාරණය ඉසීම වැනි උපක්‍රම යොදා ගැනේ. මෙයට අමතර ව පලතුරු මැස්සාගේ හානිය වැළැක්වීම සඳහා කරවිල, පතෝල, පිපිඤ්ඤා සඳහා පොලිතීන් කවර දැමීම සිදු කරන අතර ම පලතුරු මැස්සන් ආකර්ෂණ උගුල් ලෙස ප්‍රෝටීන් ඇම (Protien bait) වගාව තුළ යොදා ගනී. ඉහත සඳහන් කළ ආකාරයට බෝග විවිධාංගීකරණය මෙන් ම මනා ලෙස වගාව නඩත්තු කිරීම මගින් ද පළිබෝධ පාලනය කිරීමට අවස්ථාව සැලසේ. මෙයට අමතර ව සුදු ලූණු, ලොකු ලූණු පොතු පිළිස්සීමෙන් නිකුත් වන ගෙන්දගම් අන්තර්ගත දුම ගැසීම මගින් කෘමීන් විකර්ෂණය කිරීමට හැකියාව ඇත.

**කාබනික පොහොර භාවිතය හා ස්වාභාවික ශාක වර්ධක හෝමෝන භාවිතය**

ගෙවතු වගාව සඳහා අවශ්‍ය කොම්පෝස්ට් ගෙවත්තේ දීම නිෂ්පාදනය කළ හැකි අතර කාබනික දියර පොහොරවලට අමතරව ගැඩවිල් පණු දියර ද ගෙවත්ත තුළ ඉතා පහසුවෙන් නිෂ්පාදනය කළ හැකි වේ. ඉතාමත් සාර්ථක ශාක පෝෂකයක් වන දියර පොහොර සවස් කාලයේ යෙදීමෙන් වඩාත් සාර්ථක ප්‍රතිඵල අත්කර ගත හැකි බව පැවසේ. නිවසේ මුළුතැන්ගෙයින් කසල ලෙස ඉවත - ලන බිත්තර කටු, තේ කුඩු, කෙසෙල් ලෙලි තුළ ශාක වලට අවශ්‍ය මූල ද්‍රව්‍ය සහ පෝෂක බහුල ව අන්තර්ගතව ඇති අතර මෙවැනි ද්‍රව්‍ය පොහොර ලෙස යොදාගත හැකි ය. අතුබෑදීමේ දී කෝමාරිකා යුෂ තැවරීම මෙන් ම රිකිලි පැළ නිෂ්පාදනයේ දී යොදා ගන්නා රිකිලි පොල් වතුරේ ගිල්වා තැබීමෙන් මුල් ඇද්දවීම උත්තේජනය කිරීමේ හැකියාව පවතී. (මේවායෙ හි ස්වාභාවික හෝමෝන අඩංගු බව සැලකේ.)

**බීජ සංරක්ෂණය සහ රෝපණ ද්‍රව්‍ය සංරක්ෂණය**

ගෙවතු වගාවේ දී අවධානය යොමු කළ යුතු තවත් එක් ප්‍රධාන කරුණක් නම් එහි තිරසාර බව පවත්වා ගැනීම සඳහා ඉදිරි වගාවට බීජ හා රෝපණ ද්‍රව්‍ය සංරක්ෂණයයි. මෙහි දී හොඳ මව් ශාකයකින් ලබා ගන්නා ලද හොඳින් මේරූ ඵලවලින් බීජ ලබා ගැනීම සිදු කළ හැක. ඒ ඒ බෝගයට අනුමත ක්‍රමවේදයට අනුකූලව බීජ සකසා හොඳින් හිරු එළියේ වේලා සිසිල් කිරීමෙන් අනතුරුව ශීතකරණයේ ගබඩා කිරීමෙන් හෝ මුට්ටියක නිසි ක්‍රමවේද අනුගමනය කරමින් සිසිල් ස්ථානයක තැන්පත් කර රෙදිකඩකින් ආවරණය කිරීම මඟින් බීජ සංරක්ෂණය කළ හැක. එසේම අතු බැදීම, රිකිලි පැළ සකස් කිරීම මෙන්ම බද්ධ කිරීම (අංකුර සහ රිකිලි බද්ධය) නිවැරදි අධ්‍යයනයක් මඟින් සිදු කිරීම හරහා ඉතා පහසුවෙන් ගෙවත්ත තුළ දීම රෝපණ ද්‍රව්‍ය සංරක්ෂණය කළ හැකිය.

**තවාන් පාලනය සහ නීරෝගී රෝපණ ද්‍රව්‍ය තෝරා ගැනීම**

ගෙවතු වගාවේ පදනම වන්නේ නීරෝගී රෝපණ ද්‍රව්‍ය භාවිතා කිරීමයි. මේ සඳහා තක්කාලි, මිරිස්, වම්බටු වැනි බෝග සඳහා පැළ ලබා ගැනීමේ දී නිවැරදි තවාන් පාලනය සිදුකළ යුතු ය. එසේ නිසි නඩත්තුවකින් යුතු තවානකින් ලබා ගන්නා පැළවලින් සරු අස්වැන්නක් ලබාගත හැකි වේ. එසේ ම, එවැනි පැළ මිල දී ගන්නේ නම් පෝෂ්‍යීමත් නිරෝගී පැළ අත්‍යවශයෙන් ම තෝරා ගත යුතු ය. බද්ධ පැළ මිල දී ගන්නේ නම් බද්ධ සන්ධියට පහළින් ග්‍රාහකයේ අංකුර වර්ධනය නොවිය යුතු ය. එසේ ම, බඳුන පිටතට මුල් වර්ධනය නොවූ පැළ තෝරා ගැනීම වැදගත් වේ.
මේ අතර ලෝක ආහාර සංවිධානයට අනුව ක්ෂුද්‍ර වගාව (Micro Gardening) යනු විවිධ එළවළු වර්ග, අල බෝග සහ පලා වර්ග ඉතා සීමිත ඉඩකඩක් තුළ වගා කළ හැකි ඉතා සාර්ථක ක්‍රමවේදයකි. මෙය වයස් භේදයකින් තොරව වැඩිමහලු, ළමා මෙන් ම ආබාධිත පුද්ගලයන්ටත් නියැළිය හැකි වගා ක්‍රමයක් වන අතර අවශ්‍ය සම්පත් සූක්ෂම ආකාරයට ලබාදිය යුතු වේ. පර්යේෂණ සොයා ගැනීම් වලට අනුව වර්ග මීටරයක ක්ෂුද්‍ර වගාවක් සඳහා ජල අවශ්‍යතාවය දිනකට ලීටර් 3කට අඩු වන අතර තාක්ෂණය භාවිතයෙන් වැසි ජලය අඛණ්ඩව වගාව සඳහා සපයාගත හැකි ය. මෙයට අමතර ව පොහොර සඳහා කොම්පෝස්ට් භාවිතය මෙන් ම කාබනික වගාවේ පිළිවෙත් අනුගමනය කිරීමෙන් සාර්ථක අස්වැන්නක් ලබා ගත හැකි බව පර්යේෂණ වලින් සොයාගෙන ඇත. අධික ජන සනත්වයක් සහිත නාගරික ප්‍රදේශවල අඩු ආදායම්ලාභී ජනයාගේ ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීමෙහි ලා ඉවහල් කර ගත හැකි ඉතාම කාලෝචිත ක්‍රමවේදයක් ලෙස ක්ෂුද්‍ර වගාව සැලකිය හැකි වේ.

නිසි සැලසුමක් සහ මනා අවබෝධයකින් යුතුව ගෙවතු වගාවේ නියැළීම තුළින් භූමිය සීමාකාරී සාධකයක් වීම අවම කර, තිරසාර ගෙවත්තක් සකසා ගැනීම අපහසු කාර්යයක් නොවන බව සඳහන් කිරීම අතිශයෝක්තියක් නොවන බව සත්‍යයකි.





# වස විසෙන් තොර අපේ ගෙවත්ත




**අනූපා දිසානායක**

පර්යේෂණ නිලධාරිනී

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය




පවුලේ පෝෂණය සඳහා අවශ්‍ය වස විසෙන් තොර හා නැවුම් ආහාර නිපදවා ගැනීම ගෙවතු වගාවේ මූලික පරමාර්ථය කි. එබැවින්, රසායනික පළිබෝධනාශක භාවිතයෙන් තොරව පරිසර හිතකාමී අයුරින් ගෙවතු වගාවක් පවත්වාගෙන යාමට වග බලා ගත යුතු ය.

අතීත ශ්‍රී ලාංකික ජන සමාජයෙහි මිනිසුන් තම ජීවිකාව ලෙස ප්‍රධාන වශයෙන් ම සිදු කරනු ලැබුවේ ගොවිතැනයි. එකල සමාජය මෙන් ම සංස්කෘතිය ද සොබාදහම හා තදින් බැඳී පැවතුණි. එබැවින්, අතීතයේ සිට ම ශ්‍රී ලංකාවේ අර්ථ ක්‍රමය කෘෂිකර්මාන්තය පදනම් කරගෙන සකස් විය. අනාදිමත් කාලයක සිට මිනිසුන් තම පෝෂණ අවශ්‍යතා හා අනෙකුත් අවශ්‍යතා සපුරා ගැනීමට තම ගෙවත්ත උපයෝගී කර ගන්නා ලදී. මිනිසුන් ස්වකීය නිවස අවට පරිසරයේ එළවළු, පලතුරු, ඖෂධීය පැළෑටි, කුළු බඩු, මල් සහ දැව ආදී තමන්ට ප්‍රයෝජනවත් ශාක වර්ග වගා කිරීම අතීතයේ දී දක්නට ලැබුණු සුලභ දසුනක් විය.

කාර්මීකරණය, ගෝලීයකරණය හා නාගරීකරණය වැනි හේතු නිසා මෑත කාලීන ව ශ්‍රී ලංකාවේ ගෙවතු වගාව අතීතයේ මෙන් ම සුලභව දක්නට නො හැකි වුවත් වර්තමානයේ ද තම පෝෂණ අවශ්‍යතා සපුරා ගැනීමට ගෙවතු වගාව ප්‍රයෝජනවත් අන්දමින් සිදු කරනු ලබන අතිමහත් ජනතාවක් ශ්‍රී ලාංකික ජන සමාජය තුළ දැකිය හැකි ය.

වර්තමානය වන විට උද්ගත වී ඇති විවිධ හේතු කාරණා එනම්, වෙළෙඳපොළ තුළ පවතින මිල අධික වීම, අහිතකර කෘෂි රසායන ද්‍රව්‍ය වලින් යුක්ත වීම හා හදිසියේ උද්ගත වන්නා වූ වසංගත රෝග වැනි තත්ත්ව හමුවේ ප්‍රමාණවත් ලෙස ගුණාත්මකභාවයෙන් යුක්ත වූ අවශ්‍ය එළවළු හා පලතුරු සපයා ගැනීමට නො හැකි වීම යනාදිය නිසා පරිසර හිතකාමී ගෙවත්තක් තිබුණේ නම් යන්න වර්තමානය වන විට සැමට සිතට හැඟෙනවා විය හැකි ය. එබැවින්, පරිසර හිතකාමී ගෙවතු වගාවක් නිසියාකාරව හා ක්‍රමවත්ව පවත්වාගෙන යන්නේ කෙසේදැයි යන්න මෙම ලිපියෙන් විග්‍රහ කිරීමට අදහස් කෙරේ.

**ගෙවතු වගාව**

ගෙවතු වගාවක් පවත්වාගෙන යාම සඳහා වර්ග මීටර් 1000 එනම් අක්කර ¼ හෝ ඊට අඩු බිම් ප්‍රමාණයක් භාවිතා කිරීම පහසු වේ. විවිධ සාහිත්‍යමය ප්‍රකාශනයන් හි ගෙවත්ත යන්නට විවිධ වූ නිර්වචනයන් ලබා දී ඇති අතර ඒ සියල්ලෙහි අදහස සාරාංශගත කොට මෙලෙස දැක්විය හැකි වේ. ගෙවත්තක් යනු වාර්ෂික මෙන් ම බහු වාර්ෂික බෝග හා පශු සම්පත් වැනි ගොවිතැන් සංරචක ඒකාබද්ධ කරන තිරසාර ඉඩම් පරිහරණ පද්ධතියකි. මෙමගින් පාරිසරික සේවා, ගෘහ අවශ්‍යතා, රැකියා සහ ආදායම් උත්පාදනය කිරීමේ අවස්ථා සැපයීමක් ද සිදු වේ.

ගෙවත්තක පැවතිය හැකි මූලික අංග කිහිපයකි. මෙම අංග නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය වශයෙන් නිවාස පිහිටා ඇති ප්‍රදේශ අනුව වෙනස් වේ. එබැවින්, පහතින් දැක්වෙන අංග සියල්ලම හෝ ඒවායින් කිහිපයක් ඕනෑම ගෙවත්තක පැවතිය හැකි ය. ඒවා නම්, නිවාසය, ළිඳ හෝ ජල සැපයුම, වැට හෝ තාප්පය, කුණු රොඩු දමන වලවල්, වැසිකිළිය, බෝග (මල්, එළවළු, පලා, අල, පලතුරු, කුළු බඩු, ඖෂධ, දැව ශාක) සත්ත්ව පාලනය, ජීව වායු ඒකකය සහ මී මැසි පාලනය යනාදිය යි.

ගෙවත්තක් සැලසුම් කිරීමේ දී භූමියේ ඇති ඉඩ කඩ ප්‍රමාණය, ගෙවතු වගාව සඳහා යෙදීමට ඇති කාලය, දේශගුණික හා පාංශු ලක්ෂණ යනා දී කරුණු සැලකිල්ලට ගනිමින් ගෙවත්තට විවිධ අංගයන් එකතු කර ගැනීමේ හැකියාව පවතී. විශේෂයෙන් ම, ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට ගෙවතු වගාව සඳහා යෝග්‍ය වන සත්ත්ව පාලන ක්‍රමයක් හා මී මැසි පාලනය යනාදී ක්‍රම එකතු කර ගැනීමෙන් තම පවුලේ ආදායම හා පෝෂණය වැඩි කර ගැනීමේ හැකියාව පවතින අතර එමඟින් ශ්‍රමය හා සම්පත් කාර්යක්ෂම ව මෙන් ම ඵලදායීව භාවිතා කළ හැකි වේ.

අතීතයේ ශ්‍රී ලාංකික ගැමියා තම නිවසට අවශ්‍ය මූලික ආහාර වලින් බහුතරයක් එනම් ධාන්‍ය, එළවළු, පලතුරු, රනිල බෝග, ඖෂධ වර්ග හා කුළු බඩු සපයා ගැනීමට ගෙවතු වගාව උපයෝගී කර ගන්නා ලදී. වර්තමානය වන විටත් කුඩා බිම් කඩක වුව ද තම නිවසට අවශ්‍ය ඉහත කී මූලික ආහාර සපයා ගැනීමට වස විසෙන් තොර ගෙවතු වගාවක් පවත්වාගෙන යාමට උනන්දු පිරිස නැතුවාම නොවේ. ගෙවතු වගාව නිසා අපට ප්‍රයෝජන රැසක් උදාකර ගත හැකි ය. එවැනි වාසි කිහිපයක් පහත දැක් වේ.

- වර්තමානය වන විට සීමිත සාධකයක් සේ සලකන භූමියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි වීම
- පවුලේ සාමාජිකයින්ට තම අභිමතය හා අභිරුචිය වඩවන ආකාරයේ සමබල ආහාර වේලක් සකස් කර ගත හැකි වීම
- වස විස වලින් තොර වූ පිරිසිදු, පෝෂණයෙන් හා රසයෙන් යුක්ත වූ අලුත් එළවළු හා පලතුරු පරිභෝජනයට ගත හැකි වීම
- කොම්පෝස්ට් පොහොර සෑදීම වැනි දෑ මඟින් නිවසේ මෙන් ම ගෙවත්තේ අපද්‍රව්‍ය නැවත නැවත භාවිතා කිරීමට හැකි වීම
- පවුලේ සාමාජිකයන්ට සාමූහිකව ක්‍රියා කිරීමට හැකි නිසා පවුලේ සමඟිය වැඩි වීමට ද හේතුවක් වීම







- තමන්ට අවැසි විටක එල නෙළා ගත හැකි වීම මඟින් නැවුම් එළවළු හා පලතුරු පරිභෝජනයට අවස්ථාව සැලසීම

- තම මූලික ආහාර අවශ්‍යතා ගෙවත්තෙන් ම සපුරා ගැනීමට හැකි නිසා වෙළෙඳපොළට නිතර නිතර යාමට සිදු නොවීම මඟින් කාලය, ශ්‍රමය හා වියදම ඉතිරි කර ගත හැකි වීම
- ගෙවතු වගාවේ නිරත වීම මඟින් ශරීර සෞඛ්‍යය ද යහපත් වී මනසට සහනයක් ලැබීම
- ගහ කොළ වලින් පිරි සුන්දර පරිසරයක් නිර්මාණය වීම

කෙසේ වුව ද, ගෙවතු වගාවක් ආරම්භ කිරීමේ දී හා දිගු කාලීන ව පරිසර හිතකාමී ගෙවත්තක් පවත්වාගෙන යාමේ දී විවිධ ගැටලු හා අභියෝග වලට මුහුණ පෑමට සිදු වේ. ගෙවතු වගවේ නියැළෙන සැමට ප්‍රධාන අභියෝග හතරක් ජය ගත යුතු ම වේ. ඒවා නම් පාරිසරික අභියෝග, පවුලේ සෞඛ්‍ය හා පෝෂණය පිළිබඳ අභියෝග, ආර්ථික අභියෝග හා ආකල්පමය අභියෝග යනාදියයි. තව ද, ගෙවතු වගාවේ දී කාලගුණික හා දේශගුණික විපර්යාස මෙන් ම කෘමි උවදුරු වලට ද මුහුණ දීමට සිදු වේ. ගෙවතු වගාවේ දිගින් දිගටම ක්‍රියාකාරීව නියැලීම මඟින් ඉහත සඳහන් කළ අභියෝග සියල්ලක් ම සාර්ථකව ජය ගත හැකි වේ.

**ගෙවත්තක් සැලසුම් කිරීම**

නාගරික, අර්ධ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල එම ප්‍රදේශ අනුව ගෙවත්තක ස්වරූපය වෙනස් වේ. ඔබ නිවස අවට ගෙවත්ත ඔබට ප්‍රයෝජනවත් වන සේ බෝග වගා කිරීමට යොදා ගන්නේ නම් මූලිකව ම එහි පවතින ගොඩනැඟිලි, ගස් වැල් සහ භූමියේ ඉඩකඩ ප්‍රමාණය සැලකිල්ලට ගත යුතු වේ. ඔබ විසින් ගෙවතු වගාවක් ආරම්භ කිරීමට සැලසුම් කරන්නේ නම් ප්‍රධාන වශයෙන් ම ඉඩමේ පිහිටීම, හැඩය, පාංශු ව්‍යුහය, ජල සම්පාදන ක්‍රමය හා ප්‍රදේශයට ආවේණික ලක්ෂණ පිළිබඳව සැලකිලිමත් වීම ඉතා වැදගත් වේ. තව ද, ගෙවත්තේ සිටුවීමට බෝග තෝරා ගැනීමේ දී පවුලේ සාමාජිකයන්ගේ ආහාර රුචිකත්වය හා ප්‍රදේශයට උචිත වීම යනා දී කාරණා ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. නිවස අවට ඇති ඉඩකඩ ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් සැලසුමක් සහිත ව හෝ සැලසුමක් රහිත ව බෝග සිටුවිය හැකි වේ. නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ඉඩකඩ සීමිත වන අවස්ථාවන් හි දී සැලැස්මක් රහිත ව වගා කිරීමට සිදු වේ. මෙහි දී, සීමිත ඉඩකඩින් උපරිම ප්‍රයෝජන ගත හැකි වන සේ නිර්මාණාත්මක ලෙස විවිධ වූ උපක්‍රම ගෙවතු වගාවේ නියැළෙන ඔබට යොදා ගැනීමට සිදු වේ.

මෙහි දී, නිවස අවට මෙන් ම ඉඩකඩ ඇති ස්ථානවල පාත්ති සකස් කිරීමෙන් තොරව සුදුසු පරිදි පවුලේ සාමාජිකයන්ගේ අභිරුචිය අනුව අවශ්‍ය එළවළු, පලතුරු හා ඖෂධ පැළ වර්ග වැඩි ප්‍රමාණයක් සිටුවා ගැනීමට උත්සුක විය යුතු ය. මෙවන් අවස්ථාවක දී විවිධ බෝග වර්ග මිශ්‍ර ක්‍රමයට වුව ද වගා කළ හැකි ය.

ග්‍රාමීය ප්‍රදේශවල හා ප්‍රමාණවත් ඉඩකඩ පවතින අර්ධ නාගරික හා නාගරික ප්‍රදේශවල ඉඩකඩ පවතින නිවැසියන්ට සැලැස්මක් සහිත ව ගෙවතු වගාව සිදු කළ හැකි ය. මෙලෙස සැලැස්මක් සහිත ව වගා කිරීමේ දී විවිධ වූ බෝග වර්ග සඳහා ඊට උචිත ස්ථාන තෝරා සකස් කර ගත් වලවල් තුළ හෝ පාත්තිවල නියමිත අයුරින් පිළිවෙළකට බෝග වගා කළ හැකි ය. තව ද පොල්, කොස්, දෙල්, තේක්ක, මැහෝගනී, අඹ, රඹුටන් හා අලිපේර වැනි බහු වාර්ෂික මෙන් ම ආර්ථික වටිනාකමක් සහිත දැවමය ශාක ගෙවත්තේ මායිම් වැටට ආසන්නව හෝ නිවසේ සිට මීටර් 300 ක් තරම් දුරකින් පමණවත් සිටුවිය හැකි ය. එසේ වුව ද, එම ශාක සිටු වීම මඟින් අසල්වාසීන්ට කරදරයක් නොවීමට වග බලා ගත යුතු ය. එසේ ම, ඉඩකඩ ප්‍රමාණවත් පරිදි ඇත්නම් අඹ, අලි පේර, රඹුටන් වැනි පලතුරු ශාක ගෙවත්තේ මැද සෙවණ අවශ්‍ය වන ස්ථාන වල ද සිටුවීම උචිත වේ. තව ද, එම සෙවණ සහිත ස්ථාන වල සෙවණ ප්‍රිය කරන බෝග එනම් ගම්මිරිස්, කෝපි, කහ, ඉඟුරු, කිරි අල වැනි බෝග සිටුවිය හැකි ය.

එලෙස ම එළවළු හා පලතුරු බෝග සිටුවීම සඳහා මනා ජල වහනයක් සහිත හොඳින් හිරු එළිය වැටෙන බුරුල් සහ සාරවත් පසක් සහිත පහසුවෙන් ජලය සම්පාදනය කළ හැකි ස්ථානයක් තෝරා ගැනීම ඉතා වැදගත් වේ. තව ද, ගෙවත්තේ තෙතමනය රඳා පවතින ස්ථාන කංකුං, මුකුණුවැන්න, කොහිල ආදී එළවළු හා පලා වර්ග සිටු වීම සඳහා යොදා ගත හැකි ය. කෝමාරිකා, අක්කපාන හා තෙබු යනා දී ඖෂධීය පැළ මෙන් ම විවිධ වූ මල් පැළ නිවස ඉදිරිපස සහ වෙනත් උචිත ස්ථානවල සිටුවීම මඟින් ගෙවත්තට මෙන් ම නිවසට ද අලංකාර පරිසරයක් ළඟා කර ගත හැකි වේ. තව ද, මේ මඟින් මෙවන් වටපිටාවක් තුළ අපගේ මානසික සෞඛ්‍යය ද යහපත් වනු නො අනුමාන ය.

කෙසේ වුව ද, වර්තමානය වන විට නාගරික මෙන් ම අර්ධ නාගරික ප්‍රදේශවල ඉඩකඩ සීමිත වීම ගෙවතු වගාව සඳහා අභියෝගයක් වී තිබේ. එසේ වුව ද, ගෙවතු වගාවේ මූලික පරමාර්ථය වන්නේ අපට දිනපතා අවශ්‍ය වන පිරිසිදු හා නැවුම් එළවළු හා පලතුරු වර්ග අප විසින් නිෂ්පාදනය කර ගැනීමයි. එබැවින්, සීමාකාරී සාධකයක් වන ඉඩකඩ බාධකයක් කර නොගෙන ගෙවත්ත අස්වද්දා අපේ පෝෂණය රැක ගන්නේ කෙලෙස දැයි යන්නට විසඳුම් සෙවිය යුතු ය. එබැවින්, ගෙවතු වගාව සඳහා ඉඩකඩ නොමැති නාගරික ප්‍රදේශවල වුව ද ගෙවතු වගාව සාර්ථකව සිදු කළ හැකි ආකාරය පිළිබඳව මෙමඟින් විමසා බලමු.

**ගෙවතු වගාව සඳහා ඉඩකඩ නොමැති නාගරික ප්‍රදේශ සඳහා සරල උපක්‍රම කිහිපයක්**

- බෝග වගා කිරීම සඳහා තම ගෙවත්තේ ප්‍රමාණවත් තරම් ඉඩකඩ නොමැති අවස්ථාවල දී ඒ සඳහා විවිධ බඳුන් උපයෝගී කර ගත හැකි වේ. මෙහි දී මැටි, සිමෙන්ති, ටින්, පොලිතීන්, හාල්/කිරි පිටි කවර හෝ ප්ලාස්ටික් භාජන යනාදිය භාවිතා කළ හැකි ය. තව ද, භාවිතා කළ නො හැකිව ඉවත දැමූ ටයර, බේසම්, බෝතල් සහ පීලි යනාදිය ද නිර්මාණාත්මකව යොදා ගත හැකි වේ.
- බෝග වර්ග සිටුවීමේ දී බඳුන් වලට මතු පිට පස් හා හොඳින් දිරාපත් වූ ගොම හෝ කොම්පෝස්ට් 1:1 අනුපාතයට ගෙන පුරවා ඒවා තුළ පැළ හෝ බීජ රෝපණය සිදු කළ හැකි වේ.
- බඳුන්වල බෝග සිටුවීමේ දී ජල වහනය පිළිබඳව සැලකිලිමත් විය යුතු වේ. එබැවින්, බඳුන් වල ජල වහනය පහසු වීම සඳහා ඒවායේ ප්‍රමාණවත් තරම් සිදුරු සංඛ්‍යාවක් සකසා බඳුනේ අඩියට වැලි, කුඩා ගල් කැට හෝ බොරළු ආදිය ස්වල්ප වශයෙන් යෙදීම ඉතා සුදුසු වේ.
- ගෙවතු වගාව සඳහා කිසිසේත් ම ඉඩකඩ නොමැති අවස්ථාවක දී වගා කුළුණක් සැකසීම මඟින් පවුලේ පෝෂණයට අවශ්‍ය බෝග කිහිපයක් එකවර වගා කර ගත හැකි වේ.

**වගා කුළුණක් සකස් කර ගන්නා ආකාරය**

ලොකු ප්‍රමාණයේ පොලිසැක් මල්ලකට කොම්පෝස්ට්, දිරූ කුකුල් පොහොර හා මතු පිට පස් (1:1:1) අනුපාතයට යොදා වගා කුළුණක් සාදා ගත හැකි ය. ඉහත කී මිශ්‍රණය පිරවීමට ප්‍රථම පොලිසැක් මළු වල සිදුරු කිහිපයක් සැදිය යුතු වේ. තව ද, මෙම වගා කුළුණේ ඇතුළට අඩි 7½ක් පමණ දිග උණ ලීයක් ඇතුළු කර හරි මැදට ගෙන අඩි 1 / 1 ½ ක් පොළොව යටට යන සේ උණ ලීය සිටු විය යුතු ය. අනතුරුව සාදාගත් සිදුරු තුළ ගොටුකොළ, නිවිති, කංකුං, මුකුණුවැන්න වැනි පලා වර්ග ද තක්කාලි හා කරවිල ආදී බෝග ද වගා කුළුණ පිරෙන තුරු සිටු විය හැකි ය. මෙහි දී වැල් යන බෝග සීමිත ලෙස භාවිතා කළ යුතු අතර ඒ සඳහා ඉනි සහ ආධාරක වගා කුළුණට පිටින් සාදා ගත යුතු වේ.



වගා කුළුණට අමතර ව ඔබට ඇති සීමිත ඉඩකඩ ප්‍රමාණය උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා විශේෂ හැඩති රාක්ක (නිදසුන් - ආරක්කු හැඩති සහ පීලි සහිත තිරස් ආධාරක) බෝග සිටුවීමට යොදා ගත හැකි ය.

- කොම්පෝස්ට් පොහොර සෑදීමට බැරල් ක්‍රමය යොදා ගැනීම

පරිසර හිතකාමී ගෙවතු වගාවක් පවත්වාගෙන යැමේ දී කාබනික පොහොර භාවිතා කළ යුතු වේ. මෙහි දී සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කොම්පෝස්ට් පොහොර බොහෝ සෙයින් වැදගත් වේ. නාගරික ප්‍රදේශවල ගෙවතු වගාවේ නියැළෙන ඔබට ගොම පොහොර සොයා ගැනීම දුෂ්කර කාර්යයක් වන අතර ඊට උචිතම විකල්පයක් ලෙස ඔබේ ගෙවත්තේ දී ම කොම්පෝස්ට් පොහොර සකසා ගැනීම ඉතා පහසුවෙන් සිදු කළ හැකි වේ.

බැරල් ක්‍රමය විශේෂයෙන් ම නගරබදව සීමිත අමුද්‍රව්‍ය ප්‍රමාණයක් හා ඉඩකඩ ප්‍රමාණයක් ඇති පෙදෙසකට ඉතාමත් ම යෝග්‍ය වේ. මේ සඳහා සිමෙන්ති, යකඩ හා ප්ලාස්ටික් බැරල් බහුලව භාවිතා කරනු ලැබේ. මෙහි දී ඔබේ ගෙවත්තේ එකතු වන වියළි ශාක පත්‍ර, ගලවා දමනු ලබන වල් පැළෑටි, මුළුතැන්ගෙයින් ඉවතලන එළවළු හා පලතුරු ශේෂ, පොල් කුඩු හා සත්ත්ව වසුරු යනාදිය ද භාවිතා කළ හැකි වේ. මෙම බැරල් ක්‍රමයේ දී වාතාශ්‍රය හොඳින් පවත්වාගෙන යාම සඳහා බැරල් හි බඳේ සිදුරු සාදනු ලබන අතර එමඟින් දිරාපත් වීම ඉක්මන් කළ හැකි ය. නාගරිකව ගෙවතු වගාවේ නියැළෙන ඔබට මෙම බැරල් ක්‍රමය භාවිතයෙන් වාසි කිහිපයක් හිමි කර ගත හැකි වේ.

ඒවා නම්,

1. දෛනික ගෙදර දොර කටයුතු වල දී එකතු වන අපද්‍රව්‍ය කළමනාකරණයට අවස්ථාවක් උදා වීම
2. ගෙවත්තේ දිනපතා එකතු වන අපද්‍රව්‍ය කළමනාකරණය කර ගැනීමට උපයෝගී කර ගත හැකි වීම
3. මෙම ක්‍රමය මඟින් කොම්පෝස්ට් පොහොර සෑදීමට වාතාශ්‍රය හොඳින් ලබා දීමට හා තෙතමනය ආරක්ෂා කර ගැනීමට පහසු වීම
4. ඔබ ගෙවත්තේ සිටුවන බෝග සඳහා අවශ්‍ය කාබනික පොහොර ඉතා පහසුවෙන් නිපදවා ගත හැකි වීම

**ගෙවතු වගාවේ පළිබෝධ හා රෝග පාලනය සඳහා පරිසර හිතකාමී උපාය මාර්ග**

පවුලේ පෝෂණය සඳහා අවශ්‍ය වස විසෙන් තොර හා නැවුම් ආහාර නිපදවා ගැනීම ගෙවතු වගාවේ මූලික පරමාර්ථය කි. එබැවින්, රසායනික පළිබෝධනාශක භාවිතයෙන් තොරව පරිසර හිතකාමී අයුරින් ගෙවතු වගාවක් පවත්වාගෙන යාමට වග බලා ගත යුතු ය. එවැනි පරිසර හිතකාමී පළිබෝධ මර්දන ක්‍රම කිහිපයක් නිදසුන් ලෙස පහත දක්වා ඇත.

- බීජ පැළ හෝ රෝපණ ද්‍රව්‍ය තෝරා ගැනීමේ දී කන්නයට

හෝ ප්‍රදේශයට, පසට උචිත වූත්, ඔරොත්තු දෙන ප්‍රභේද තෝරා ගැනීම

- කාබනික පොහොර භාවිතය
- අවශ්‍ය ප්‍රමාණයට පමණක් ජලය සම්පාදනය කිරීමට වග බලා ගැනීම
- පසේ ජලවහනය දියුණු කිරීම සඳහා සුදුසු උපක්‍රම අනුගමනය කිරීම
- අනවශ්‍ය තරඟකාරී ශාක ඉවත් කිරීම
- දිරාපත් වූ හා වියළී ගිය අතු ඉවත් කිරීම මෙන් ම වල් නෙළීම යනාදිය නිසි කලට සිදු කොට වගාවට මැනවින් හිරු එළිය ලැබීමට සැලැස්වීම
- රෝග හා කෘමි හානි පවතින කොටස් වෙන් කර දුර බැහැරට දැමීම හෝ විනාශ කිරීම මඟින් වගාවේ පවිත්‍රතාවය සුරැකීම
- විශේෂිත රෝග හා පළිබෝධකයින් මර්දනය කිරීමට හැකි කෘමි විකර්ශක ශාක වර්ග වගාවන් අතර සිටුවීම. උදා - දහස් පෙතියා
- පාරම්පරික ව පැවත එන කෙම් ක්‍රම අනුගමනය කිරීම උදා - කොහොඹ ඇට ද්‍රාවණය යෙදීම, අළු සත්කාරය හා කිරිබත් අයිල තැබීම
- පලතුරු හා එළවළු විදින කෘමීන්ගෙන් හා දිලීර රෝග වලින් ආරක්ෂා කර ගැනීම සඳහා තෙල් කඩදාසි හෝ පොලිතීන් වලින් ආවරණය කිරීම
- ශෂ්‍ය මාරු ක්‍රමය අනුගමනය කිරීම හා එකම බෝගය හෝ එකම කුලයේ බෝග විශාල ලෙස දීර්ඝ කාලීන ව වගා නො කිරීම
- තව ද, ගෙවතු වගාව වාණිජමය වගාවක් නොවන බැවින් පළිබෝධ හා රෝග හානි අවම වන බෝග වර්ග තෝරා ගැනීම ද උචිත වේ

ඉහත සඳහන් කළ විවිධ හා සරල උපාය මාර්ග යොදා ගැනීම තුළින් ග්‍රාමීය, අර්ධ නාගරික හා නාගරික ප්‍රදේශවල වෙසෙන සියලු ජනතාවට පරිසර හිතකාමී ගෙවත්තක උරුමකරුවකු වීම අපහසු කාර්යයක් නොවේ.

කෙසේ වුව ද, ශතවර්ෂ ගණනාවක් පුරාවට ශ්‍රී ලංකාවේ ගෙවතු වගාව භූ දර්ශනයේ හා සංස්කෘතියේ අනිවාර්යය අංගයක් වූ අතර මෙය ගතික වූත්, තිරසාර වූත් ආහාර නිෂ්පාදන පද්ධතියක් ලෙස ද හැඳින්විය හැකි ය. ශ්‍රී ලංකාවේ ගෙවතු දිවයිනේ විවිධ ප්‍රජාවන්ගේ සමාජ, ආර්ථික, සංස්කෘතික, පාරිසරික අවශ්‍යතාවයන්ට හා භූ දර්ශනයට සරිලන පරිදි පරිණාමය වී ඇති අතර ඒවා තවමත් දිවයිනේ ඉඩම් පරිහරණයේ ප්‍රධාන ආකාරයක් ලෙස පවතී.

දිනෙන් දින වෙනස් වෙමින් පවතින ලෝකයක් තුළ කාර්මික සංවර්ධනය, නාගරීකරණය වැනි විවිධ හේතු නිසාවෙන් මෑත කාලීන ශ්‍රී ලංකාවේ ජනතාව තම දෛනික ආහාර අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වෙළෙඳපොළට යාමට පුරුදු විය. එබැවින්, ශ්‍රී ලංකාවේ පැවති යැපුම් කෘෂිකර්මාන්තය ක්‍රමයෙන් වාණිජ කෘෂිකර්මාන්තයක් දක්වා විකාශනය විය. වර්තමානය වන විට ග්‍රාමීය ජනතාව පවා තම දෛනික එළවළු හා පලතුරු අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා වෙළෙඳපොළට යාම පුරුද්දක් කර ගෙන සිටියි. එවිට ඒවා සඳහා ඉල්ලුම වැඩි වී ඇති අතර එම ඉල්ලුමට සරිලන සැපයුමක් පවත්වා ගැනීම සඳහා වෙළෙන්දන් ද විවිධ උපක්‍රම යොදා ගනු ලබයි.

ගෙවතු වගාව කෙරෙහි පැවති උනන්දුව අඩු වීම හේතුවෙන් මේ වන විට ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික හා පාරිසරික ගැටලු රැසක් උද්ගතව තිබේ. ගම්බද ගොවීන් පවා වාණිජමය වගාවන් කෙරෙහි බහුල වශයෙන් යොමු වීම නිසා කැළෑ එළි කිරීම වර්තමානය වන විට සුලභව දක්නට ලැබේ. මේ හේතුවෙන් පස සෝදා යාම, ජල උල්පත් සිඳී යාම වැනි විපත් රාශියක් උද්ගත ව ඇත. ඉහළ යන ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීමට ගොවීන් විසින් වැඩි වශයෙන් කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් වර්තමානය වන විට පරිසර දූෂණය වීම වැනි මිනිසාගේ පැවැත්මට අහිතකර දෑ සිදු වෙමින් පවතී. මේ හේතු නිසාවෙන් මිලෙන් අධික ගුණාත්මකභාවයෙන් අඩු හා කෘෂි රසායනික ද්‍රව්‍යයන් යොදන ලද එළවළු හා පලතුරු නිරන්තරයෙන් වෙළෙඳපොළ තුළ දක්නට ලැබේ. එලෙස ම වර්තමානය වන විට ලෝක වාසී සැමට මුහුණ පෑමට සිදු වී ඇති ව්‍යසන හා වසංගත තත්ත්ව හමුවේ ද මිනිසුන්ට තම දෛනික අවශ්‍යතා සඳහා එළවළු හා පලතුරු වෙළෙඳපොළට ගොස් මිල දී ගැනීමට නො හැකි වී තිබේ.

අප සැම දෙනාට ම පවුලේ පෝෂණයට දිනපතා අවශ්‍ය වන පිරිසිදු හා නැවුම් එළවළු හා පලතුරු වර්ග මෙන් ම වෙනත් බෝග වර්ග අප විසින් ම නිෂ්පාදනය කර ගැනීමේ හැකියාව පවතී. තව ද, වර්තමානය වන විට උද්ගතව ඇති ස්වභාවික ව්‍යසනයන්ගෙන් ආරක්ෂා වී ජීවත් වීම සඳහා මිනිසා හිතකර පරිසරයක් ඇති කර ගැනීමටත්, වස විසෙන් තොර රස ගුණයෙන් හා නැවුම් බවින් යුක්ත එළවළු හා පලතුරු අපේ ගෙවත්තේම නිපදවා ගැනීමටත් සියලු දෙනාම උත්සුක විය යුතු ය. අපේ ගෙවත්ත අස්වැද්දීම තුළින් මෙවන් ව්‍යසන අවස්ථාවක වුව ද අපට දැයට රුකුලක් වීමට හැකි වේ. එබැවින් මතු අනාගතය ගැන සිතා හැකි තැන වගා කිරීමට ඔබත් සිතට ගත යුතු ය. ඒ සඳහා අප සැවොම කළ යුත්තේ අපේ මුතුන් මිත්තන් අතීතයේ දී සොබාදහමට ලැදිව කටයුතු කළ ආකාරය ආදර්ශයට ගනිමින් පරිසර හිතකාමී ගෙවතු වගාවක් වෙත යළිත් නැඹුරුවීමයි.



# ගොවිජනතා අභියෝග පිළිබඳ කතිකාවත




**එම්.එම්.පාලිත මහින්ද මුණසිංහ**

ගොවිපළ යාන්ත්‍රික උපදේශක

දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය

හෝමාගම




විදේශ රටවලින් මෙරටට ගෙන්වන සමරූපී නිෂ්පාදන වෙළෙඳපොළට මුදාහැර දේශීය ගොවීන්ගේ නිෂ්පාදන අඩු මිලකට තක්සේරු කර මිල දී ගැනීම හා මිල දී ගත් නිෂ්පාදන ශීත ගබඩා තුළ රැස්කර කෘත්‍රිම ලෙස ආහාර බෝග මිල ගණන් ඉහළ දැමීමේ සූක්ෂම ක්‍රමවේදය නිශ්චිත ව හඳුනා ගෙන අප එය ව්‍යර්ථ කළ යුතු ව ඇත.

මෙරට සෑම කෙනෙකුට ම ප්‍රමාණවත් ආහාර සම්පාදනය සඳහා පහසුකම් සැපයීම රජයක වගකීමයි. මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සීමිත ගොවිපළ තුළින් එක්රැස්වන අස්වනු ප්‍රමාණවත් නොවන අතර ඉන් බැහැර ව ආහාර හා බෝග නිෂ්පාදනය කර සපයන්නේ ගොවීන් ය. මෙම ගොවීන් අතුරෙන් අතිබහුතරය කුඩා ඉඩම් හිමියෝ වෙති. කුඩා ඉඩම් හිමි ගොවීන් යනු බොහෝ විට හෙක්ටයාර් දෙකකට වඩා අඩු ඉඩම් ප්‍රමාණයක් ගොවිතැන් කරන හෝ දිනකට රුපියල් 1500 -3000 ට වඩා අඩු ආදායමක් උපයන ජන කොටසකි. මෙරට තුළ මිලියන 1.6ක පමණ පිරිසක් මේ යටතේ ගොවිතැන සඳහා යොමු ව සිටියි. වාර්ෂික ආහාර නිෂ්පාදනයෙන් 80% පමණ ප්‍රමාණයකට දායක වන මොවුන් විශාල පිරිසක් වසර ගණනාවක සිට දේශගුණික විපර්යාස, දේශපාලන ප්‍රතිපත්ති හා දේශීය ආර්ථිකය ගෝලීයකරණයට ගොදුරු වීමේ අවදානමට ලක් ව සිටිති. මෙම තත්ත්වය හමුවේ කෘෂිකාර්මික කටයුතු සඳහා ඔවුන්ගේ දායකත්වය ද කළින් කලට අඩු වැඩි වේ. එසේ ම, පරම්පරාවෙන් පරම්පරාවට ණයගැතිභාවයෙන් අත්මිදීම සඳහා සීමා රහිත අරගලයක ඔවුහු නිරත වෙති. මෙකී අභියෝග හමුවේ ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින කුඩා ඉඩම් හිමි ගොවීහු මේ සඳහා මුහුණ දෙන්නේ කෙසේ ද යන්න පිළිබඳව විමසා බැලීම කාලෝචිත වේ.

විශේෂයෙන් ම, ආහාර නිෂ්පාදනය කිරීම සඳහා කුඩා ඉඩම් හිමි ගොවීන්හට හොඳ තත්ත්වයේ යෙදවුම් සඳහා ප්‍රවේශයක් අවශ්‍ය වන අතර ඔවුන්ගේ වගාබිම් සඳහා යෝග්‍ය පසක් ගොඩනඟා ගැනීමට සිදු වේ. ඒ සඳහා හිතකර පාරිසරික දේශගුණයක් ද අවශ්‍ය වේ. ගොවිතැනට අදාළ උපකරණ හා මූලික යෙදවුම් වල මිල ගණන් බොහෝ විට තීරණය වන්නේ දේශීය ව පණවන ආනයන බදු මත ය. රසායනික පොහොර හා යන්ත්‍රෝපකරණ වැනි ගොවිපළ අවශ්‍යතා ජාත්‍යන්තර මිල අනුව තීරණය වන බැවින් බොහෝ කුඩා පරිමාණ ගොවීහු මෙකී යෙදවුම් ලබා ගත නො හැකි තත්ත්වයකට පත් ව සිටිති. එමෙන් ම, ගොවියාට පාලනය කර ගැනීමට නො හැකි එක් සාධකයක් වන්නේ යන්ත්‍රෝපකරණ සේවා සඳහා වන පිරිවැයයි.

කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ ඵලදායිතාව ඉහළ නැංවීමට උත්සාහ කරන විට මුහුණ දෙන තවත් ගැටලුවක් වන්නේ නවීන කෘෂිකාර්මික යෙදවුම් මිල දී ගැනීමට ප්‍රාග්ධනය ලබා ගන්නේ කොතැනින් ද යන්නයි. නිදසුනක් වශයෙන් බැංකු හෝ ණය සමිති නොමැති සමහර ප්‍රදේශවල වල් නාශකයක්, පළිබෝධ නාශකයක් හෝ වැඩිදියුණු කළ බීජ පමණක් නොව පොහොර පවා මිල දී ගැනීම සඳහා ගොවීන්හට ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීම ඉතා අපහසු ය.

එබැවින්, ගොවීන් සමහර විට යෙදවුම් මිල දී ගැනීම සඳහා ණය මෝරුන්ගෙන් අධික පොලී අනුපාත යටතේ ණය ලබාගැනීමට පෙළඹෙයි. බෝග වගාව අසාර්ථක වුවහොත් ඔවුන්ට ණය හෝ ඒ සඳහා පොලිය ආපසු ගෙවීමට ක්‍රමයක් නොමැති වේ. මූල්‍ය සැපයුම් ආයතන නොමැති විට එහි ප්‍රතිඵලයක් වශයෙන් නවීන කෘෂිකාර්මික යෙදවුම් ප්‍රවර්ධනය කිරීමට ඇති හැකියාව සීමිත වේ. එසේ ම, කුඩා ඉඩම් හිමි ගොවීන්හට වෙළෙඳපොළ වෙත පිවිසීමට අරගල කිරීමට සිදුවන අවස්ථා විරල නොවේ. ඔවුන්ගේ නිෂ්පාදනවලට ප්‍රමාණවත් ගබඩා හා සැකසුම් පහසුකම් ලබාගත නො හැකි බව ප්‍රසිද්ධ ගැටලුවකි. එසේ ම, කෘෂි නිෂ්පාදන බෙදා හැරීමට හා අලෙවි කිරීමට ඔවුන්ට අසීමාන්තිකව වෙහෙස වීමට පවා සිදු වී තිබේ.

කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ නිෂ්පාදන කටයුතු කෙරෙහි බලපාන තවත් තීරණාත්මක සාධකයක් වන්නේ දේශීය පළාත් බද ශ්‍රම සංක්‍රමණයයි. සංවර්ධනය වෙමින් පවතින අන් රටවල මෙන් ම මෙරට බොහෝ ප්‍රදේශවල මිනිසුන් වඩා හොඳ වැටුප් සහිත රැකියා සොයමින් කෘෂිකර්මාන්තය අතහැර යාම දක්නට ලැබෙන සුලබ දසුනකි. දිගු කාලීන ව කෘෂිකාර්මාන්ත අංශයේ නිරත වන පවුල්වල අළුත් පරපුරේ සාමාජිකයින් ග්‍රාමීය පෙදෙස් හි සිට අඩු කායික වෙහෙසක් සහිත රැකියා වෙත සංක්‍රමණ වීම හේතුවෙන් රෝපණ හා අස්වනු නෙළන කාලවල දී ඇති වන ශ්‍රම හිඟයෙන් කෘෂිකර්මාන්තයට දැඩි බලපෑමක් එල්ල වේ. මේ හේතුවෙන් කුඩා ඉඩම් හිමි ගොවීන් ඉහළ ශ්‍රම ඉල්ලුමක් සහිත වකවානුවල දී ඉහළ යන වැටුප් හේතුවෙන් දිවා කම්කරුවන් බඳවා ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුව තිබේ. ගොවිපළවල සිටින ශ්‍රමිකයින්ට වැඩි පහසුකම් හා අතිරේක ආදායම් මාර්ග ලබා දීමෙන් මෙම තත්ත්වය අවම කර ගත හැකිවේ. එසේ වුව ද, එවැනි වෙනස්කම් නිසා ශ්‍රමය නොමැති ව හොඳ අස්වැන්නක් ලබා ගැනීම දුෂ්කර වීම සිදු වේ.

කෙසේ වුව ද, කුඩා ඉඩම් හිමි ගොවීන්හට පාලනය කළ හැකි ක්ෂේත්‍ර කිහිපයක් වන්නේ පාංශු සෞඛ්‍යය ගොඩනැඟීම සහ බෝග සඳහා අවැසි කාබනික පොහොර නිෂ්පාදනයයි. මේ උදෙසා කුඩා පට්ටි වශයෙන් පශු සම්පත් සඳහා ආයෝජනය කිරීමෙන් තම පසෙ හි කාබනික ද්‍රව්‍ය ගොඩනඟා ගත හැකි ය. මෙය බෝග ඵලදායිතාව ඉහළ නංවා ගැනීමට ද උපකාරී වේ. එකී කාබනික ද්‍රව්‍ය පසෙ හි තෙතමනය රඳවා ගන්නා ස්පොන්ජියක් මෙන් ක්‍රියා කිරීමෙන් පාංශු උෂ්ණත්වය යම් තරමකින් හෝ පහත දැමීම සිදු වේ.

එබැවින්, ගොවීන්හට උදව් කිරීමට කුමක් කළ හැකි ද? යන්න විමසීමේ දී උපාය මාර්ග ලෙස කාබනික පොහොර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම, බෝග අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම හෝ මිශ්‍ර බෝග හා පශු සම්පත් ප්‍රවර්ධනය කිරීම මඟින් පාංශු සෞඛ්‍ය



වැඩි දියුණු කිරීමට උපකාර කිරීම වඩාත් සාර්ථක වේ.

තවත් උපාය මාර්ගයක් වන්නේ ගොවිතැන් සඳහා ආයෝජනය කිරීමට අවශ්‍ය ප්‍රාග්ධනය ගොඩනඟා ගැනීමත්, දැඩි මූල්‍ය අවදානම්වලට නිරාවරණය නොවීමටත්, සමුපකාර හා ණය සැපයුම් සේවා වැනි මූල්‍ය ආයතන ගොවීන් සමඟ සුහදව කටයුතු කිරීමට පෙළඹවීමත් යනාදිය යි. කුඩා ඉඩම් හිමි ගොවීන් ලාභ ලැබීමට පෙර විවිධ අභියෝගයන්ට මුහුණ දිය යුතු ය. නිෂ්පාදිත ද්‍රව්‍ය සඳහා වෙළෙඳපොළවල් සොයා ගැනීමට කුඩා ඉඩම් හිමි ගොවීන්හට වඩා හොඳ උන්නතිකාමී ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු ය. මේ සඳහා  ආහාර බෝග නිෂ්පාදන දිගු කාලයක් පවතින පරිදි උසස් ප්‍රමිතියෙන් යුක්තව ගබඩා කිරීමට සහ පෙර සැකසුම් කිරීමට, පහසුකම් ඇතිකිරීමට කටයුතු කිරීම කෙරෙහි රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අවධානය යොමුකළ යුතු වේ.

කුඩා පරිමාණ ගොවීන්ට ගොවිතැන දිගටම කරගෙන යාමට හැකි වන පරිදි ශ්‍රමය ඉතිරි කිරීමේ ක්‍රමවේදයක් ලෙස ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වඩා හොඳ වැටුප් සහිත රැකියා සෙවීම සඳහා සංක්‍රමණය වීම අවම කිරීම තවත් වැදගත් උපාය මාර්ගයකි. එසේ වුව ද, කුමන උපාය මාර්ගයක් අනුගමනය කළ ද සාධක දෙකක් සලකා බැලිය යුතු ය. පළමුවැන්න සෑම දෙයක් ම එකිනෙක හා ගලපා ගැනීමයි. අඩු වියදම් ණය හෝ බෝග රක්ෂණ ලබා දිය හැකි මූල්‍ය උපකරණ නොමැති විට නව කෘෂිකාර්මික යෙදවුම් අර්ථවත්ව සංවර්ධනය කිරීමට ඉඩක් නැත. එහි ප්‍රතිඵලයක් වශයෙන් කුඩා ඉඩම් හිමි ගොවීන් යටතේ ක්‍රියාත්මක වන සන්දර්භය පිළිබඳ විශාල චිත්‍රයක් ප්‍රතිපත්ති සම්පාදකයින් හා වෘත්තිකයන් මතකයේ තබා ගත යුතු ය. ඒ වෙනුවෙන් අපි කුඩා ඉඩම් හිමියන්ට උපකාර කිරීම සඳහා නව උපාය මාර්ග හෝ දියුණු ශිල්පීය ක්‍රම යෝජනා කිරීමට පෙර එකී ක්‍රියාවලිය සඳහා කුඩා ඉඩම් හිමි ගොවියන් ද සම්බන්ධ කර ගත යුතු ය.

කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ වගාවන් සාර්ථක කර ගැනීමට නව කෘෂිකාර්මික තාක්ෂණයන් සඳහා ආයෝජනය කිරීම හෝ නව බීජ ප්‍රභේද රෝපණය කිරීම බොහෝ විට අත්‍යවශ්‍ය පියවරකි. මෙම අවදානම දැරීම වළක්වන බාධක කිහිපයක් විස්තර කරමු. කුඩා වතු හිමියන් සඳහා තාක්‍ෂණය සැලසුම් කිරීමේ දී මෙම මෙවලම් කාන්තාවන් විසින් භාවිතා කරන බව ද මතක තබා ගැනීම වැදගත් වන අතර ඒවා සංස්කෘතිකමය වශයෙන් ද සුදුසු විය යුතු ය. එසේ ම, මෙම ගොවිජනතාව ශ්‍රම ඉතිරි කිරීමේ තාක්ෂණයන් භාවිතා කිරීම වළක්වන පොදු බාධක කිහිපයක් දැකිය හැකි ය. ඒ අනුව, ආහාර බෝග නිෂ්පාදනය වැඩි කිරීම සඳහා නව්‍ය තාක්ෂණික ක්‍රමෝපායයන් හඳුනා නො ගැනීම විශේෂිත වේ. එසේ ම, එවැනි දේ කෙරෙහි අනුගත වීමට මැලිවන්නෝ ද විරල නොවේ. කෙසේ වෙතත්, මේ සඳහා බොහෝ විට නො පැහුනු පූර්ව තාක්ෂණික ක්‍රමෝපායයන් හේතුකාරක විය හැකි ය. එසේ වුව ද, කුඩා පරිමාණ ගොවීන් දේශීය ආර්ථිකය ප්‍රවර්ධනය කරන, එයට බලපෑම් එල්ල කළ හැකි පිරිසක් බව අප අවබෝධ කරගත යුතු ය.

එමෙන් ම, ගොවිතැන් කටයුතු කාලගුණික රටාවන් මත මුළුමනින් ම රඳා පවතින බැවින්, දේශගුණික විපර්යාස කුඩා ඉඩම් හිමි ගොවීන්ට විශාල අවදානමක් ඇති කරයි. එසේ ම, ගොවීන්හට කාලගුණික විපර්යාස පාලනය කළ නො හැකි දෙයක් වන අතර 21 වන සියවසෙන් ඔබ්බට වඩාත් දරුණු දේශගුණික විපර්යාසයන් ගෙන් පිරි ලෝකයක් බිහිවනු ඇතැයි පරිසර හා කාලගුණ විද්‍යාඥයින් අනුමාන කරයි. ඒ හේතු කොට ගෙන කුඩා ඉඩම් හිමි ගොවීන්හට විවිධ අභියෝග වලට මුහුණ දීමට සිදුවනු ඇත. මෙහි බරපතලම ප්‍රතිවිපාක ඇතිකරන්නේ ජල හිඟය හා පරිසර උෂ්ණත්වය ඉහළ යාමෙනි. මෙම සන්දර්භය තුළ අනාගතයේ දී ගොවීන්ගේ වගා කටයුතු කෙරෙහි වන බලපෑම අවම කිරීම සඳහා අනුගමනය කළ හැකි උපාය මාර්ග වශයෙන් නව තාක්ෂණික වගා ක්‍රම හා වගා ව්‍යුහ කෙරෙහි කුඩා ඉඩම් හිමි ගොවීන් යොමු කරවීම සිදු කළ හැකි ය. එසේ වුව ද, බොහොමයක් ගොවීන්හට අනාගතය සඳහා ආයෝජන කිරීමට තරම් වත්කමක් නොමැති වීම ගැටලු සහගත තත්ත්වයකි. කෙසේ වුව ද, ගොවීන්හට ආධාර කිරීම සඳහා වඩාත් ඵලදායී කාලගුණ අනාවැකි පුරෝකථන තාක්ෂණවේදයක් කෘෂි දේශගුණික කලාප ආශ්‍රිත ව ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම මෙයින් අවධාරණය කෙරේ. ගොවිතැනෙ හි නිරත වන මෙම පිරිසට වඩා හොඳ ආදායමක් අවශ්‍ය

වන නිසා ස්ථාවර ආහාර ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට හිමිකම් පෑ හැකි වගාබිම් ඔවුන්ගේ මූලික අවශ්‍යතාවන් ගෙන් එකක් ලෙස හැඳින්විය හැකි ය. වගා කිරීමට උචිත ඉඩම් සඳහා වූ ප්‍රවේශය කුඩා පරිමාණ ගොවියාගේ පාලනයෙන් සම්පූර්ණයෙන් ම බැහැර වූ තවත් එක් ගැටලුවකි. ඉඩම් හිමිකාරිත්වය කෘෂිකාර්මික වගා කටයුතු අඛණ්ඩ ව කරගෙන යාමට කුඩා ඉඩම් හිමි ගොවියන් කෙරෙහි බෙහෙවින් බලපායි. විශේෂයෙන් ම, දේශීය ඉඩම් ව්‍යාපාර සංවර්ධනය කර විකිණීමේ ලේබලය යටතේ දිවයින පුරා වගා කළ හැකි ඵලදායී ඉඩම් මිල දී ගනිමින් හා කැබලි කරමින් කුඩා පරිමාණ ගොවීන් අවතැන් කරන බව පැහැදිලි ව දැකිය හැකි ය. වගා කළ හැකි ගොවිබිම් මිල දී ගැනීමේ ක්‍රියාවලිය බොහෝ විට යටත් විජිතවාදයේ නව ප්‍රවේශයකි. මෙමඟින් පෙන්නුම් කරන්නේ මෙරට දැනට සිදුවෙමින් පවතින ඉඩම් කොල්ලය කොතරම් සංකීර්ණ ද යන්නයි. මෙම ගැටලුව විසඳාලීම සඳහා ගොවිතැනෙ හි නිරත වීමට කැමති පුරවැසියන්හට නිශ්චිත ඉඩම් ප්‍රමාණයක් සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ ලබාදිය යුතු ව තිබේ. කෙසේ වුව ද, දැනට පවතින භයංකාර තත්ත්වය වළකාගත හැක්කේ අවංක රාජ්‍ය සේවකයන් හට පමණි. ගොවීන්හට තම වගා කටයුතු වෙනුවෙන් ගොවිබිම් මිල දී ගැනීමේ දී මුහුණ දෙන මෙම අභියෝග දේශීය ආහාර බෝග නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සහ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා සෘජුව ම බලපා ඇති බව සඳහන් කළ හැකි ය.

එසේ ම, දේශගුණික හා කාලගුණික විපර්යාසයන්ගෙන්, රෝග හා පළිබෝධ මෙන් ම වන සතුන්ගෙන් සිදුවන උවදුරු හමුවේ කුඩා පරිමාණ ගොවීන්ගේ මූල්‍ය ආයෝජන හා එම ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීමට උචිත ක්‍රමවේද හඳුන්වාදිය යුතු වේ. ඊට හේතු වන්නේ ගොවීන් විසින් ගනු ලබන වගා ණය ගෙවාගත නො හැකි වූ විට ඔවුන් සියදිවි නසාගැනීමට පෙළඹීමට හේතුකාරක වන්නේ මෙවැනි ක්‍රමවේදයක් පැහැදිලි ව ක්‍රියාත්මක නොවන බැවිනි. මෙයට හේතුකාරක වන්නේ බැංකු සහ පෞද්ගලික ආයතන ක්ෂුද්‍ර ණය ක්ෂේත්‍රයේ දරන ආධිපත්‍යය මත බොහෝ විට නිකුත් කරන ණය සඳහා ඉහළ පොලී අනුපාත අය කරමින් ගොවියන් තව තවත් දරිද්‍රතාවයට තල්ලු කිරීම යි.

එමෙන් ම, පසෙ හි කාබනික ද්‍රව්‍ය මට්ටම අඩු කරන හා පාංශු ඛාදනය පහසු කරවන කෘෂිකාර්මික ක්‍රමවේදයන්ගෙන් බැහැර ව තිරසාර ආහාර නිෂ්පාදනයක් වෙනුවෙන් අප කටයුතු කළ යුතු වේ. ඒ සඳහා පසට කාබනික ද්‍රව්‍ය එක්කාසු කිරීම, නියඟයට ඔරොත්තු දීමේ හැකියාව සහිත නව බෝග වර්ග හඳුන්වා දීම සහ පාංශු ඛාදනය අවම වන පරිදි ගොවිතැන් කිරීමට ගොවීන් වඩ වඩාත් යොමු කිරීම සිදු කළ යුතු වේ. එසේ ම, තාක්ෂණික අනුවර්තන සඳහා වූ ආයෝජන ද්‍රව්‍ය සපයා ගැනීම උදෙසා අවශ්‍ය මුදල් සම්පාදනය කිරීම හෝ සීමිත සම්පත් ප්‍රමාණයක් ව්‍යාපෘති ඔස්සේ ලබාදීම පමණක් ඉටුකිරීමෙන් නොනැවතී එම කටයුතු දිගුකාලීනව වර්ධනය කරගැනීමෙහි ලා ගොවියා නිරත වන්නේ ද යන්න අඛණ්ඩ ඇගයුමකට නතු කරගත යුතු වේ. මෙලෙසින් කෘෂිකාර්මික ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමට කුඩා ඉඩම් හිමි ගොවීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම අතිශය ඵලදායී ක්‍රමවේදයක් බව සඳහන් කළ හැකි ය.

වර්තමානයේ දී කුඩා ඉඩම් හිමි ගොවියන් සෘජුව ම අලෙවි කටයුතු සඳහා වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වෙනවා ද යන්න හොඳින් විමසා බැලිය යුතු තවත් සුවිශේෂි කරුණකි. විශේෂයෙන් ම මේ උදෙසා සහභාගී වීමේ පිරිවැය ඔවුනට ඉතා වැදගත් වේ. උදාහරණයක් ලෙස භූගෝලීය වශයෙන් විසිරී ඇති බොහෝ කුඩා ඉඩම් හිමි ගොවියන්හට සීමිත නිෂ්පාදන සමඟින් වෙළෙඳපොළවලට සහභාගී වීමට ඇති අවස්ථා ඉහළ ප්‍රවාහන වියදම් හා අඩු පහසුකම් මත ව්‍යර්ථ වී තිබේ. එබැවින් එම සැපයුම් තැරැව්කාර පුද්ගලික වෙළෙඳුන් විසින් ලබා ගෙන ද්විතියික ගැනුම්කරුට හෝ වෙළෙඳපොළට ප්‍රවාහනය කිරීම සාමාන්‍යයෙන් අලෙවිකරණයේ දැකිය හැකි ලක්ෂණයක් වන අතර කුඩා පරිමාණ ගොවියෙකු මුහුණ දෙන කණගාටුදායකම ගැටලුව ද මෙය විය හැකි ය. මෙම ගැටලුවට විසඳුම වන්නේ හොඳ තත්ත්වයේ නිෂ්පාදන සාධාරණ මිල ගණන් යටතේ සත්‍ය ගැනුම්කරුවන් හට (තොග වෙළෙඳ ව්‍යාපාරිකයිනට) එකතු කර ගැනීම සඳහා පොදු ප්‍රවේශ ස්ථාන ස්ථාපිත කිරීම ය. මෙහි දී ගොවීන්හට පොකුරු වශයෙන් සංවිධානය වී එමඟින් තම නිෂ්පාදන පහසුවෙන් අලෙවි කර ගැනීමට වඩා හොඳ අවස්ථාවක් සැලසේ. ගැනුම්කරු හා ගොවියා අතර සෘජු සන්නිවේදනයක් සඳහා වූ දිරිගැන්වීමේ ක්‍රමයක් ලෙස ද මෙය හඳුන්වාදිය හැකි වේ.

දේශීය කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ බෝග නිෂ්පාදන අලෙවි කර ගැනීම කෙරෙහි බලපාන තවත් තීරණාත්මක බලපෑමක් වන්නේ වගා කළ කෘෂි බෝග අස්වනු රැස් කිරීමට ආසන්න වකවානු වල දී ගොවීන් එරෙහිව ක්‍රියාත්මක වන ආනයන ව්‍යාපාරික මාෆියාවයි. විශේෂයෙන් ම විදේශ රටවලින් මෙරටට ගෙන්වන සමරූපී නිෂ්පාදන වෙළෙඳපොළට මුදාහැර දේශීය ගොවීන්ගේ නිෂ්පාදන අඩු මිලකට තක්සේරු කර මිල දී ගැනීම හා මිල දී ගත් නිෂ්පාදන ශීත ගබඩා තුළ රැස්කර කෘත්‍රිම ලෙස ආහාර බෝග මිල ගණන් ඉහළ දැමීමේ සූක්ෂම ක්‍රමවේදය නිශ්චිත ව හඳුනා ගෙන අප එය ව්‍යර්ථ කළ යුතු ව ඇත. නො එසේ නම් මෙරට කෘෂි බෝග නිෂ්පාදන අතිරික්තයක් කෘත්‍රිම ව ගොඩ නැංවීම තුළින් ඔවුන් දේශීය ගොවියා අසරණ කරවීම වළකාගත නොහැක.

එමෙන් ම, සිය ජීවිකාව කරගෙන යාම සඳහා දෛනිකව මෙම පිරිසට පරිභෝජනයට හොඳ ආහාර පාන සපයා ගත යුතු වේ. එසේ වුව ද, මෙම ගොවීන් අතුරෙන් බහුතරයකට ස්වකීය ආහාර රටාව තමන් උපයන ආදායම සහ දේශීය වෙළෙඳපොළ විසින් තීරණය කරනු ලබන අනෙකුත් පාරිභෝගික ද්‍රව්‍යයන් සමඟ පිරිමසා ගත නො හැකි තත්ත්වයකට පත් වී සිටිති. මෙම තත්ත්වයෙන් ඔවුන් මුදවා ගැනීම සඳහා කටයුතු කිරීම දේශීය කෘෂිකර්මාන්තයේ ප්‍රගමනයට හේතුකාරක වනු නො අනුමානය.



# බඩ ඉරිඟු බෝග වගාවේ මෑත කාලීන ප්‍රවණතා




රුවිනි විදානපතිරණ

ජ්‍යෝෂ්ඨ පර්යේෂණ නිලධාරිනී

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය




ශ්‍රී ලංකාව තුළ වගා කරන ලද භූමි ප්‍රමාණය, ආනයනය සඳහා වැය වන පිරිවැය සහ කෘෂි ආශ්‍රිත කර්මාන්ත සැලකීමේ දී බඩ ඉරිඟු දෙවෙනි වන්නේ සහල් වලට පමණි.

බඩ ඉරිඟු zea mays L. යන උද්භිද විද්‍යාත්මක නමින් හැඳින්වෙන අතර තිරිඟු සහ සහල් වලින් පසු ලෝකයේ වැදගත් ම ධාන්‍ය වර්ගය යි. බඩ ඉරිඟු පහසුවෙන් වගා කළ හැකි සහ ලාභදායි බෝගයක් වන බැවින් එය ගොවීන් අතර ජනප්‍රිය ව පවතී. ශ්‍රී ලංකාව තුළ වගා කරන ලද භූමි ප්‍රමාණය, ආනයනය සඳහා වැය වන පිරිවැය සහ කෘෂි ආශ්‍රිත කර්මාන්ත සැලකීමේ දී බඩ ඉරිඟු දෙවෙනි වන්නේ සහල් වලට පමණි. ආහාර නිෂ්පාදනය සහ සත්ත්ව ආහාර නිෂ්පාදනයේ මෑතකාලීන ව සිදු ව ඇති වර්ධනය හේතුවෙන් බඩ ඉරිඟු සඳහා ඉල්ලුම ඉහළ ගොස් තිබේ. බඩ ඉරිඟු ප්‍රධාන වශයෙන් මහ කන්නයේ දී වගා කරන අතර වාර්ෂික නිෂ්පාදනයෙන් සියයට 85ක් පමණ එම කන්නය තුළ වර්ෂාපෝෂිත ව වගා කරනු ලබයි. මෙරට පවතින වර්ෂාපතන රටාවන් අනුව මාස 3 -3 ½ ක කාලයක් තුළ අස්වැන්න නෙළාගත හැකි ප්‍රභේද කිහිපයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර තිබේ. රුවන්, භද්‍රා, අරුණ, මුතු සහ සම්පත් ඉන් ප්‍රධාන වේ. ඊට අමතර ව ආනයනික දෙමුහුම් ප්‍රභේද වන පැසිපික් ප්‍රභේද ද ගොවීන් අතර බහුල ව භාවිතා වේ.

**බඩ ඉරිඟු නිෂ්පාදනය සහ ආනයනය**

වසර 2000 සිට 2018 දක්වා ශ්‍රී ලංකාව තුළ බඩ ඉරිඟු වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර් 28,646 සිට හෙක්ටයාර් 70,895 දක්වා කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබේ. 2018 වසරේ දී බඩ ඉරිඟු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 270,041ක් විය. එනම්, සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 3.8කි. මෙසේ බඩ ඉරිඟු ශ්‍රී ලංකාව තුළ ගොවීන් අතර ජනප්‍රිය වූ සහ නිෂ්පාදන මට්ටම වර්ධනය වූ බෝගයක් වන අතර එයට හේතු වන්නේ පෙහොර යෙදවුම් ප්‍රමාණවත් ව පැවතීම (වී වගාව සඳහා සහනාධාර ලෙස ලැබෙන පොහොර ග්‍රාමීය ගොවි ජනතාව විසින් භාවිතා කිරීමෙන්), ආකර්ෂණීය සහ ස්ථාවර වෙළෙඳපොළක් පැවතීම හා වැඩි අස්වැන්නක් ලබා දෙන දෙමුහුන් බඩ ඉරිඟු බීජ භාවිතය ගොවීන් අතර ප්‍රචලිත වීමයි.



ශ්‍රී ලංකාවේ වියළි හා අතරමැදි කලාපවල ප්‍රධාන වශයෙන් බඩ ඉරිඟු වගා කරන අතර පසුගිය වසර පහක (2014-2018) සාමාන්‍ය නිෂ්පාදනය සැලකීමේ දී මොණරාගල සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කවල බඩ ඉරිඟු ප්‍රධාන වශයෙන් වගා කෙරේ. ඊට අමතර ව බදුල්ල, අම්පාර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක වල ද ව්‍යාප්ත ව පවතී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බෝග පුරෝකථන වාර්තාවට අනුව 2018/2019 මහ කන්නයේ දී බඩ ඉරිඟු හෙක්ටයාර් 88,154 ක් වගා කර තිබූ අතර සේනා දළඹුවාගේ හානිය හේතුවෙන් සහ නියං ගංවතුර තත්ත්වයන් හේතුවෙන් හෙක්ටයාර් 43,576ක් හානි වී තිබුණි. ඒ හේතුවෙන් මෙට්‍රික් ටොන් 79,982ක නිෂ්පාදන හානියක් සිදු වී තිබේ. එසේ වුව ද, පෙර කන්නයට සාපේක්ෂව වගා කරන ලද භූමි ප්‍රමාණය ඉහළ යාම හේතුවෙන් එම කන්නය තුළ දී මෙට්‍රික් ටොන් 250,672 ක අස්වැන්නක් ලබා ගැනීමට හැකි විය.

එසේ වුව ද, බඩ ඉරිඟු සඳහා ජාතික අවශ්‍යතාවය වාර්ෂිකව මෙට්‍රික් ටොන් 400,000ක් පමණ වන අතර දේශීය ව නිපදවනු ලබන්නේ මුළු අවශ්‍යතාවෙන් 68%ක් පමණි. එම නිසා, 2018 වර්ෂයේ දී බඩ ඉරිඟු මෙට්‍රික් ටොන් 120,568ක් ආනයනය කිරීමට සිදු වූ අතර ඒ සඳහා වැය වූ ආනයනික පිරිවැය රුපියල් මිලියන 5,937ක් විය.

බඩ ඉරිඟු ආශ්‍රිත නිෂ්පාදන වන බඩ ඉරිඟු පිටි, ඉරිඟු තෙල්, Cornflakes වැනි ආහාර සඳහා නාගරික ප්‍රදේශ වල ඉහළ ඉල්ලුමක් පවතින අතර මෙම නිෂ්පාදන බොහොමයක් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබේ. පසුගිය වසර දෙක තුළ විවිධ කර්මාන්ත සඳහා බඩ ඉරිඟු ආනයනය ප්‍රධාන වශයෙන් රුමේනියාව, ඉන්දියාව, යුක්රේනය සහ පාකිස්ථානයෙන් සිදුවිය (රේගු දෙපාර්තමේන්තුව, 2018).





වසර 2011 සිට 2014 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව බඩ ඉරිඟු වලින් ස්වයංපෝෂිත මට්ටමක පැවති නිසා ආනයනික මට්ටම ඉතා අඩු අගයක
පැවතුණි. එසේ වුව ද, ඉන්පසු එහි වර්ධනයක් දක්නට ලැබුණි. ශ්‍රී ලංකාවේ වාර්ෂිකව බඩ ඉරිඟු ආනයනය සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක පමණ විශාල විදේශ විනිමය ප්‍රමාණයක් දැරීමට සිදු වේ.

බඩ ඉරිඟු වගාව ව්‍යාප්තිය සඳහා රජය විසින් මේ දක්වා ගෙන ඇති ක්‍රියා මාර්ග සැලකීමේ දී කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් බඩ ඉරිඟු සඳහා සහතික මිලක් ලබාදීමට පියවර ගෙන ඇති අතර ඒ අනුව කිලෝවකට රුපියල් 43ක සහතික මිලක් 2019 වර්ෂයේ දී නියම කර තිබුණි. තව ද, බඩ ඉරිඟු ගොවීන්ගේ බීජ සඳහා වැය වන පිරිවැයෙන් 50%ක් රජය විසින් දැරීමට ද තීරණය වී ඇත. එසේ ම, බඩ ඉරිඟු වගා කරන ගොවීන්ට පොහොර සහනාධාරය හිමි වන අතර වගා හානි සඳහා අක්කරයකට රුපියල් හතළිස්දාහක වගා රක්ෂණයක් ද ලබා දේ. මෑතකාලීන ව සේනා දළඹුවාගේ හානියට ලක් වූ වගා බිම් සඳහා රජය විසින් දැරූ පිරිවැය රුපියල් මිලියන 250 කි.

**ආහාර සැකසීම සහ සත්ත්ව ආහාර සඳහා බඩ ඉරිඟු අවශ්‍යතාවය**

බඩ ඉරිඟු විශාල වශයෙන් කර්මාන්ත විභවයක් පවතින බෝගයකි. තැම්බූ නො මේරූ බඩ ඉරිඟු (කිරි ඉරිඟු) මෙරට ජනතාව අතර ඉතා ජනප්‍රිය ආහාරයකි. යල කන්නයේ නිපදවන බඩ ඉරිඟු වලින් වැඩි ප්‍රමාණයක් පාරිභෝජනය කරනු ලබන්නේ කිරි ඉරිඟු වශයෙනි. බේබි කෝන් (baby corn) ලෙස හැඳින්වෙන කුඩා අවධියේ දී නෙළාගත් ළපටි කරල් (සෙ.මී. 6-9 පමණ දිග) සුපිරි වෙළෙඳසැල් හා සංචාරක හෝටල්වල ආහාර පිළියෙල කිරීමට යොදා ගනී.



එසේ ම, රත්කිරීමෙන් පොරි (popcorn) ලෙස සාදා ගන්නා බඩ ඉරිඟු ද බහුල වශයෙන් පාරිභෝජනයට යොදා ගනී. ඉඩ ඉරිඟු වලින් සකස් කර ගන්නා උදෑසන ආහාරයක් වන cornflakes වැඩි වශයෙන් මෙරටට ආනයනය කරන මිල අධික, ළමුන් අතර ජනප්‍රිය ආහාරයකි. ශ්‍රී ලංකාව තුළ ත්‍රිපෝෂ ප්‍රතිලාභීන් සංඛ්‍යාව (ගර්භණී මවුවරුන්, කිරිදෙන මව්වරුන් සහ ළදරුවන්) දළ වශයෙන් මිලියනයක් පමණ වන අතර මාසික අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 1,500 කි. එනම්, වාර්ෂිකව මෙට්‍රික් ටොන් 18,000ක් පමණ ඒ සඳහා අවශ්‍ය වේ. මෙම ඉල්ලුම සපුරාලීමට බඩ ඉරිඟු අවශ්‍යතාවය වාර්ෂිකව මෙට්‍රික් ටොන් 15,000කි. එසේ ම plenty food වැනි ආයතන විවිධ ධාන්‍ය ආහාර, සමපෝෂ සැකසීම සඳහා සහල්, සෝයා, මුං ඇට සමඟ බඩ ඉරිඟු විශාල වශයෙන් භාවිතා කරයි. මෙසේ සකස් කරන ලද ධාන්‍ය ආහාර වෙළෙඳපොළ තුළ බහුල ව පවතින අතර කුඩා ළමුන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීමට දායක වේ. මෙවැනි සමාගම් තෝරා ගත් ගොවි කණ්ඩායම් මඟින් ගිවිසුම්ගත වගා ක්‍රමයට (contract farming) බඩ ඉරිඟු අනුරාධපුරය සහ මොණරාගල දිස්ත්‍රික්කවල ගොවීන්ගෙන් සහතික කළ මිලක් යටතේ මිල දී ගැනීම සිදුකරන අතර ගුණාත්මක මට්ටමෙන් ඉහළ නිෂ්පාදන මිල දී ගැනීම සිදු වේ.

සත්ත්ව නිෂ්පාදනයේ දී සතුන්ට සපයන ආහාරවල ප්‍රධාන ශක්ති සංඝටකයක් ලෙස බඩ ඉරිඟු භාවිතයට ගනු ලැබේ. වෙනත් ධාන්‍යවලට වඩා ඉක්මනින් ජීර්ණය වන නිසා සත්ත්ව ආහාරවල, ආහාර පරිවර්තන කාර්යක්ෂමතාව ඉහළින් ම පවත්වා ගැනීමට මෙය උපකාරී වේ. විශාල පරිමාණ සත්ත්ව නිෂ්පාදකයන් විසින් කුකුළු ආහාර සඳහා අමුද්‍රව්‍යයක් ලෙස බඩ ඉරිඟු ගොවියාගෙන් සෘජුව මිල දී ගෙන ගබඩා කරනු ලබන අතර මෙවැනි ගබඩා පහසුකම් ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ ආශ්‍රිතව ස්ථාපිත කොට තිබේ (උදා. ක්‍රිස්බෝ සමාගම, KST සහ ප්‍රීමා). ක්රිස්බෝ සමාගම මඟින් මොණරාගල දිස්ත්‍රික්කය තුළ මෙට්‍රික් ටොන් 10,000ක ධාරිතාව -යෙන් යුතු ගබඩා සංකීර්ණයක් මේ සඳහා ඉදිකර ඇත.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්ත-මේන්තුවේ ගෘහ ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව, කුකුළු මස් සඳහා ඒක් පුද්ගල පාරිභෝජනය 2010 දී කිලෝ 4.86 සිට 2018 වන විට කිලෝ 12 දක්වා වර්ධනයක් පෙන්නුම් කරයි. බිත්තර පරිභෝජනය 2010 දී බිත්තර 29ක් ව පැවති අතර 2018 වන විට එය 37 දක්වා ඉහළ යෑම තුළින් මෙම නිෂ්පාදන සඳහා වාර්ෂිකව වර්ධනය වන ඉල්ලුමක් පවතින බව පැහැදිලි වේ. එම නිසා, පසුගිය වසර දහයක (2008-2018) කාලය තුළ කුකුළු මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 102,000 සිට 214,000 දක්වා ද බිත්තර නිෂ්පාදනය මිලියන 1,900 සිට මිලියන 2,851 දක්වා ද වැඩි වී ඇත. මේ හේතුවෙන් කුකුළු ආහාර සඳහා වර්ධනය වන ඉල්ලුමක් පවතින අතර සත්ත්ව ආහාර හා නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව කුකුළු ආහාර නිෂ්පාදනය 2010 සිට 2018 දක්වා කාලය තුළ මෙට්‍රික් ටොන් 285.57 මෙට්‍රික් ටොන් 771.77 දක්වා වර්ධනයක් පෙන්නුම් කරයි.



කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය යෙදවුම් සැලකීමේ දී දළ වශයෙන් 60%ක් බඩ ඉරිඟු අමුද්‍රව්‍යයක් ලෙස යොදාගනී. වර්තමානය වන විට බඩ ඉරිඟු මිල කිලෝවකට රුපියල් 52.00 දක්වා ඉහළ ගොස් තිබේ. සාමාන්‍යයෙන් මහ කන්නයට අදාළ බඩ ඉරිඟු නිෂ්පාදනය මැයි මාසය පමණ වන විට අවසන් වන බැවින් දේශීය වශයෙන් ද මිල ගණන් ඉහළ යෑමක් අපේක්ෂා කෙරේ. වසරේ අග භාගය පමණ වන විට විශාල වශයෙන් ආනයනික බඩ ඉරිඟු මත යැපීමට සිදුවන අතර මේ වන විට ආනයනික බඩ ඉරිඟු සඳහා මිල ගණන් ඉහළ යමින් පවතී. මේ හේතුවෙන් රට තුළ කුකුළු ආහාරවල මිල ගණන් 2010 සිට 2018 දක්වා කාලය තුළ වාර්ෂික වර්ධනයක් දක්නට ලැබේ. මේ අනුව පෙනීයන්නේ දේශීය බඩ ඉරිඟු නිෂ්පාදනය වැඩි වන සත්ත්ව ආහාර නිෂ්පාදනයට අවශ්‍ය ඉහළ ඉල්ලුම සඳහා ප්‍රමාණවත් නොවන අතර එමඟින් කුකුළු කර්මාන්තයට දිගු කලක් තිස්සේ ගැටලු සහගත තත්ත්වයක් උද්ගත වී ඇති බවයි. මෙසේ කුකුළු ආහාර මිල ඉහළ යෑම කුකුළු මස් හා බිත්තර යන දෙවර්ගය සඳහා නිෂ්පාදන පිරිවැය ඉහළ යාමට හේතු වේ. එමෙන් ම, එය වෙළෙඳපොළ තුළ කුකුළු මස් හා බිත්තර මිල ගණන් හි වර්ධනයට බලපෑම් ඇති කරයි. එමෙන් ම, ශ්‍රී ලාංකික පාරිභෝගිකයින් වැඩි වශයෙන් තම ප්‍රෝටීන අවශ්‍යතාවය සපුරාලීම සඳහා කුකුළු මස් හා බිත්තර මත යැපීම තුළ මිල ගණන් හි වර්ධනයට දැඩි බලපෑම් ඇති කරයි.

බඩ ඉරිඟු සඳහා වර්ධනය වන ඉල්ලුමක් පැවතීම හේතුවෙන් ගොවීන්ට නිෂ්පාදන ඉලක්ක ළඟා කරගත හොත් වෙළෙඳපොළ ගැටලු පැන නොනඟිනු ඇත. මෙසේ දේශීය බඩ ඉරිඟු කර්මාන්තය මෙන් ම කුකුළු කර්මාන්තය නංවාලීම සඳහා බඩ ඉරිඟු නිෂ්පාදනය සහ එහි ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා නව ක්‍රමවේද හඳුන්වා දීමට අවශ්‍ය පියවර ගැනීම වැදගත් වේ. බඩ ඉරිඟු නිෂ්පාදනය ඉහළ නැංවීම මෙරට සත්ත්ව නිෂ්පාදන කර්මාන්තවල අපේක්ෂිත වර්ධනය සඳහා අත්‍යාවශ්‍ය වේ. එසේ ම, කෘෂි අංශයේ සේවා නියුක්තිය තව තවත් වර්ධනය කර ගැනීමටත් එමඟින් හැකියාව ලැබේ.

**ගොවි ජනතා සඟරාව තුළ ප්‍රකාශයට පත්වන ලිපි මඟින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ හෝ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අදහස් පිළිබිඹු නොවන අතර ලිපිවල අන්තර්ගතය සම්බන්ධ සම්පූර්ණ වගකීම ලේඛකයින්**



# කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය තුළින් ආර්ථිකය ගොඩනගමු



මහේෂ් බණ්ඩාර
තාක්ෂණ සහායක කෘෂි ව්‍යාප්ති
ශාක නිරෝධායන ඒකකය
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ
කටුනායක



ලොව ම ගිලගත් කොවිඩ් 19 වසංගතය හමුවේ දැඩි ව බැට කෑ ඇමරිකා එක්සත් ජනපදනය සහ යුරෝපා කලාපයේ රටවල ආහාර නිෂ්පාදනය අවම වීම නිසා එම අවශ්‍යතාව සපුරා ගැනීමට විදේශයන්ගෙන් ආහාර ආනයනය කිරීමට පෙළඹී සිටී.

පුරාතනයේ සිට ශ්‍රී ලංකාව ජාත්‍යන්තර අවධානය දිනා ගැනීමට ප්‍රධාන හේතුවක් වන්නේ ශ්‍රී ලංකාවේ සුවිශේෂී භූගෝලීය පිහිටීමත්, පෙර අපර දෙදිග සම්බන්ධ කළ මුහුදු සේද මාවතේ පිහිටි වාණිජමය කේන්ද්‍රස්ථානයක් වීමත් නිසාවෙනි. ක්‍රි.ව.410 දී පමණ සුප්‍රසිද්ධ චීන දේශාටකයෙකු වන ෆාහියන් බෞද්ධ භික්ෂූන් වහන්සේ ශ්‍රී ලංකාවේ සංචාරය කළ අතර උන්වහන්සේගේ වාර්තාවල ශ්‍රී ලංකාව මැණික් ඇත්දළ, මුතු සහ කුළු බඩු අපනයනය සම්බන්ධයෙන් ප්‍රසිද්ධියට පත්ව තිබූ බව සඳහන් කරයි. පුරාණ රජ දවස මෙරටින් සහල් ඇතුළු ධාන්‍ය අපනයනය කළ බවත් එබැවින් “පෙරදිග ධාන්‍යාගාරය” යන විරුදාවලියෙන් ද ශ්‍රී ලංකාව හැඳින්වූ බවත් කියැවේ.

ඉන් පසුකාලීන ව, බටහිර අධිරාජ්‍යවාදීන් ශ්‍රී ලංකාව සිය ග්‍රහණයට ගැනීමට ද ප්‍රධාන හේතුවක් වන්නේ ඉස්තරම් වර්ගයේ කුළුබඩු වලට මහත් ප්‍රසිද්ධියක් ඉසිලීම යන කාරණයයි. විශේෂයෙන්ම නැගෙනහිර යුරෝපයේ වාසිදායක කුළු බඩු වෙළෙඳාම කෙරෙහි ඒකාධිකාරයක් පිහිටුවීමට උත්සාහ කළ රටවල් වන පෘතුගාලය සහ ඕලන්දය මේ අතර ප්‍රධාන ය. ඉන් අනතුරුව, බ්‍රිතාන්‍යයන් මෙරට යටත් කර ගැනීමෙන් පසුව සින්කෝනා, කෝපි සහ තේ, අපනයනය ප්‍රචලිත විය.

මේ අනුව බලන විට ඈත අතීතයේ සිට ම කෘෂිකාර්මික අපනයනයන් මෙරට ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම වෙනුවෙන් සුවිශේෂී දායකත්වයක් සපයා ඇත.

වර්තමානය වන විට, අන්තර්ජාතික වෙළෙඳාම බහුපාර්ශ්වීය සම්මුතීන්, එකඟතාවන් සහ ගිවිසුම් මඟින් නියාමනය කෙරේ. මේ අතරින් කෘෂිකාර්මික නිෂ්පාදනයන් අපනයනයන් ආවරණය වන ජාත්‍යන්තර සම්මුතිය වන්නේ ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 170ක් අපරානුමත කළ ජාත්‍යන්තර ශාක ආරක්ෂණ සම්මුතියයි. (International Plant Protection Convention/IPPC) ශාක හා ශාක නිෂ්පාදනයන්ගෙන් පළිබෝධ හා ලෙඩ රෝග දේශසීමා හරහා ව්‍යාප්තිය වළක්වා ගැනීම සඳහා වූ IPPC සම්මුතිය මෙරට තුළ ක්‍රියාවට නැංවෙන්නේ 1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනත යටතේ ය. මෙම පනතෙ හි නිසි බලධරයා කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්තුමා වන අතර ක්‍රියාත්මක කිරීමේ වගකීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීම සහ පැළෑටි සංරක්ෂණ සේවයට පැවරී තිබේ. ඒ යටතේ ඇති ජාතික ශාක නිරෝධායන සේවය කෘෂිකාර්මික නිෂ්පාදන ආනයනය සහ අපනයනය පිළිබඳව සෘජු මැදිහත්වීමක් සිදු කරයි.



**කෘෂි නිෂ්පාදන අපනයනය කිරීම**

තේ, රබර් සහ පොල් යනා දී ප්‍රධාන අපනයන බෝගයන් හා ආශ්‍රිත නිෂ්පාදන, එළවළු, පලතුරු, කුළුබඩු, විසිතුරු පත්‍රික ශාක, කැපුම් මල්, ජලජ ශාක මෙරටින් ප්‍රධාන වශයෙන් අපනයනය කරයි. ඒ සඳහා ජාතික ශාක නිරෝධායන සේවයේ ගුවන් තොටුපොළ සහ වරාය ඒකක වලින් නිකුත් කරන ශාක ස්වස්ථතා සහතිකයක් (Phytosanitary Certificate) ලබා ගැනීම අනිවාර්ය වේ. (මෙම ඒකක කටුනායක, මත්තල සහ යාපනය ගුවන් තොටුපොළවල සහ කොළඹ වරායේ ස්ථාපනය කර ඇත. ) ඒ සඳහා ජාතික නිරෝධායන සේවය මඟින් නිකුත් කරන ලද අයදුම්පත්‍රයක් සම්පූර්ණකොට ඉදිරිපත් කළ යුතුවේ. ඉන් අනතුරුව, එම ඒකකයන්ට අනුයුක්තව සේවය කරන ශාක නිරෝධායනය නිලධාරීන් විසින් අදාළ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පරීක්ෂා කර බලා ඒවා රෝග සහ පළිබෝධවලින් තොර බැව් තහවුරු කර ගැනීමෙන් අනතුරුව සහ අපනයනය කරන රටෙහි ආනයනික නීතිරීතිවලට අනුව අපනයනය කෙරෙන බවටත් සහතික කිරීමෙන් අනතුරුව ශාක ස්වස්ථතා සහතික නිකුත් කරනු ලැබේ. මෙම ශාක ස්වස්ථතා සහතිකයක වලංගු කාලසීමාව දින 14කි. ඇතැම් අවස්ථාවල අදාළ ශාක හෝ ශාක නිෂ්පාදන අයත් වන රාජ්‍ය ආයතනවලින් එම අපනයනයන්ට විරෝධතාවයක් නොමැති බැව් සඳහන් ලිපි (No Objection letters)අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.



උදාහරණ ලෙස පොල් ආශ්‍රිත (ඇතැම්) නිෂ්පාදන සඳහා පොල් පර්යේෂණායතනය සහ පොල් සංවර්ධන මණ්ඩලය ද, රෝපණ ද්‍රව්‍ය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ද, ජලජ ශාක හා දැව වර්ග සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ද, ඖෂධ ශාක සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් ද ආදී වශයෙනි.

විසිතුරු පත්‍රික ශාක සහ කැපුම් මල් අපනයනය සඳහා වගා කරන ක්ෂේත්‍ර සහ යුරෝපීය සංගමයේ රටවලට අපනයනය කරන කරවිල, පතෝල, පේර, මුකුණුවැන්න, තම්පලා සහ අඹ ක්ෂේත්‍රයන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අධීක්ෂණය කරනු ලැබේ.

සමහරවිට ආනයනික රටෙ හි අවශ්‍යතාවය අනුව එම අපනයනය කරන නිෂ්පාදන ධූමකරණය කළ යුතු වේ. අපනයන ද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය, ගුවන් සහ මුහුදු මඟින් අපනයනයේ දී හානි නොවන අයුරින්, නැවුම් බව සුරක්ෂිත වන අයුරින් සහ ආනයනික රටෙහි ජාතික ශාක නිරෝධායන සේවය (National Plant Protection Organization) අනුමත කරන ආකාරයට තීරණය කළ යුතු ය. තව ද, අපනයනය කරන ශාක හෝ ශාක ආශ්‍රිත නිෂ්පාදනයන් හි පස් අඩංගු නොවිය යුතු ය.

නිරන්තරයෙන් තම නිෂ්පාදනයන් ආනයනික රටෙ හි ගැණුම්කරුවන් හරහා එම රටෙ හි ශාකමය නිෂ්පාදනයන් ආනයනයන්ට අදාළ කොන්දේසි පිළිබඳව දැනුවත් වීම නුවණට හුරු ය. පසුගිය දිනක සමාජ මාධ්‍ය තුළ සංසරණය වූ ඡායාරූපයක දැක්වුණේ විදේශීය සුපිරි වෙළෙඳසැලක කෙසෙල්බඩ විකිණීමට තබා ඇති අයුරුයි. ඉන් ගම්‍ය වන්නේ මෙරට කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය කෙතරම් පරාසයකට විසිරුවාලිය හැකි ද යන්නයි.

ලොව ම ගිලගත් කොවිඩ් 19 වසංගතය හමුවේ දැඩි ව බැට කෑ ඇමරිකා එක්සත් ජනපදනය සහ යුරෝපා කලාපයේ රටවල ආහාර නිෂ්පාදනය අවම වීම නිසා එම අවශ්‍යතාව සපුරා ගැනීමට විදේශයන්ගෙන් ආහාර ආනයනය කිරීමට පෙළඹී සිටී. යුරෝපා වෙළෙඳපොළ වෙත එළවළු, පලතුරු ඇතුළු කෘෂි නිෂ්පාදන අපනයනය කරන ප්‍රධාන රටක් වන ඉන්දියාව ද කොවිඩ් - 19 වසංගතයෙන් තදින් බැටකෑම නිසා යුරෝපා වෙළෙඳපොළ අවශ්‍යතාවය සපුරාලීමට අපොහොසත් වනු ඇතැයි පුරෝකතනය කෙරේ. එබැවින්, මෙම කාල සීමාව කෘෂිකාර්මික බෝග වගාවට මෙන් ම අපනයනයේ නව මානයන් සොයා යෑමට ද එතුළින් තම ආර්ථිකය මෙන් ම ජාතික ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට ද නවමාවත් සොයා ගැනීමට ද අවධානය යොමු කිරීම වැදගත් වේ. විශේෂයෙන් ම, රට වසා තැබුණු කාලසීමාව තුළ නිවෙස්වල රැඳී සිටි බොහෝ දෙනා සිය එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය එළවළු සහ පලතුරු සිය ගෙවතු තුළ ම වගා කිරීමට පෙළඹීම නිසා වාණිජමය වශයෙන් එළවළු සහ පලතුරු වගා කරන ගොවි මහතුන්ට අනාගතයේ දී සිය අස්වැන්න විකුණා ගැනීමේ අභියෝගයට මුහුණ දීමට සිදුවනු නො අනුමානය. එම අභියෝගය ජය ගැනීමට නම් මෙරට තුළ නිෂ්පාදිත අතිරික්ත කෘෂි නිෂ්පාදන ලෝක වෙළෙඳපොළ වෙත අපනයනයට අවශ්‍ය පියවර ගතහොත් එතුළින් මෙම කොවිඩ් - 19 වසංගතය අපට වෙස්වලාගත් ආශිර්වාදයක් කර ගැනීමට හැකි වනු නො අනුමාන ය.



# ආහාර ගබඩාකරණයේ දී හානි කරන කුරුමිණියන්



**ආචාර්ය චොලී විජයරත්න**
ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය,
ශාක විද්‍යා අධ්‍යයන අංශය,
කෘෂිකර්ම පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
අනුරාධපුරය



ගබඩා කළ ධාන්‍ය හා එකී නිෂ්පාදන වලට කෘමීන් නිසා වන හානිය දළ වශයෙන් සංවර්ධිත රටවල අස්වැන්නෙන් 10%ක් සහ සංවර්ධනය වෙමින් පවතින රටවල 20%ක් ලෙස ගණන් බලා ඇත.

වී සහ අනෙකුත් ධාන්‍යවල අස්වනු නෙළීම, පිරිසිදු කිරීම, වියළීම, වර්ග කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම, සැකසුම් හා පරිභෝජනය අතරතුර සිදුවන හානිවීම පසු අස්වනු හානි වේ. ගබඩා කළ ධාන්‍ය හා එකී නිෂ්පාදන වලට කෘමීන් නිසා වන හානිය දළ වශයෙන් සංවර්ධිත රටවල අස්වැන්නෙන් 10%ක් සහ සංවර්ධනය වෙමින් පවතින රටවල 20%ක් ලෙස ගණන් බලා ඇත. ශ්‍රී ලංකාවේ මේ තත්ත්වය යටතේ, වී ඇතුළු ධාන්‍ය ගබඩා කිරීමේ දී අස්වැන්නෙන් 4-6% හානි වන අතර, ඉන් ඉහළම දායකත්වය කෘමි පළිබෝධකයන් නිසා සිදුවන බව හඳුනාගෙන ඇත. සජීවී සහ මියගිය කෘමීන් සිටීම, කෘමීන් බැහැර කරන අපද්‍රව්‍ය ආහාර වල තිබීම නිසා ගබඩා කරන කෘෂි නිෂ්පාදන පරිභෝජනයට නුසුදුසු තත්ත්වයට පත්වේ.

ගබඩා කරන ලද නිෂ්පාදන වලට කෘමීන් නිසා සිදුවන පාඩු ප්‍රමාණාත්මක හෝ ගුණාත්මක වශයෙන් වර්ග කළ හැකිය. ඒ අනුව කෘමීන් ධාන්‍ය වර්ග ආහාරයට ගන්නා විට ධාන්‍යවල බර අඩුවීම ප්‍රමාණාත්මක අලාභයකි. කෘමීන් නිසා වන ගුණාත්මක පාඩු ලෙස පෝෂ්‍ය පදාර්ථ නැතිවීම. ධාන්‍යවල ප්‍රරෝහණ හැකියාව අඩු කිරීම ,ධාන්‍ය දුර්වර්ණ වීම ,පුස් වර්ධනය ,ධාන්‍ය කැදැලි ඇතිවීම ,දුර්ගන්ධය ,රසය වෙනස් වීම, ලෙස හඳුනාගත හැකිවේ.

**ගබඩා කරන ලද ආහාරවලට හානි කරන කෘමීන් වර්ග**

ගබඩා කරන ලද ආහාර හා ඒ ආශ්‍රිත නිෂ්පාදන වලට හානි කරන කෘමීන් ප්‍රධාන ව වර්ග දෙකකි. එනම් කුරුමිණි/ගුල්ලන් වර්ග හා සලබයන් වේ. මෙම ලිපිය මඟින් ප්‍රධාන කෘමීන් වර්ග හා ඔවුන්ගෙන් සිදු වන විවිධ හානි පිළිබඳ ව අවධානය යොමු කෙරේ.

**වී ගුල්ලා (Rice Weevil)**

වඩාත් විනාශකාරී ගබඩාගත කෘමීන්ගෙන් එක් අයෙකි. සුහුඹුල් කුරුමිණියා මිලි ලීටර් 2-4 තද දුඹුරු කළු වර්ණයෙන් යුතු ය. හිසෙන් නෙරා ඇති ලාක්ෂණික තුන්ඩයක් වේ. එයින් ධාන්‍ය කොටස් කපයි. ඔවුන්ගේ පියාපත් මත තැඹිලි පැහැති කුඩා ලා පැහැති ලප හතරක් ඇත. වැඩිහිටි කෘමීන් හා කීටයන් ධාන්‍ය වර්ග ආහාරයට ගනී. ගැහැණු කෘමීන් ධාන්‍ය මතුපිට සිදුරු සාදා ඇතුළත බිත්තර දමා ඉටි ස්‍රාවයකින් සිදුර මුද්‍රා කරයි. එක ගැහැණු සතෙකු බිත්තර 150-300 දමයි. දින 6ක දී බිත්තර පිපිරී කීටයන් පිටවන අතර ඔවුන් ධාන්‍ය තුළ පෝෂණය වෙමින් උමං තනයි. සුහුඹුල් කෘමීන් ධාන්‍ය වලින් මතු වන අතර ලාක්ෂණික සිදුරක් වී බීජයේ ඉතිරි වේ. සුහුඹුල් කෘමීන්ගේ ආයු කාලය මාස 4-12 වේ.

**වී කුරුමිණියා (Lesser grain borer)**

සුහුඹුල් කෘමියා හා ඔවුන් දමන බිත්තර වලින් බිහිවන කීටයන් වී සහ සහල් වලට බරපතල හානි කරයි. වැඩිහිටි කෘමියා මිලිමීටර් 3ක් පමණ දිග තද දුඹුරු පැහැති සිලින්ඩරාකාර ශරීරයකින් යුක්ත ය. පියාපත් මත සිහින් සිදුරු ඇත. ඉහළින් බැලූ විට, හිස උරස මඟින් සඟවා ඇත. ගැහැණු සතුන් බිත්තර 500 ක් පමණ ධාන්‍ය මත ලිහිල් ව දමයි. සුහුඹුල් කෘමියා පියාසර කරන්නෙකි. කීටයන් සුදු පැහැති ය. ධාන්‍ය අභ්‍යන්තරය ආහාරයට ගනී. සුහුඹුල් කෘමීන් ධාන්‍ය වලින් මතු වේ. ජීවන චක්‍රය සති 3-6 දක්වා වේ. සුහුඹුල් කෘමීන්ට වසර 3ක් දක්වා ජීවත් විය හැකිය.

**රතු පිටි කුරුමිණියා (Red Flour Beetle)**

සුහුඹුල් කුරුමිණියන් මිලි මීටර් 3-4 පැතලි, දිගටි, රතු පැහැයට හුරු දුඹුරු පැහැයක් ගනී. සුහුඹුල් කෘමීන් හා කීටයන් ධාන්‍ය ආහාරයට ගනී. හානියට පත් නොවූ සම්පූර්ණ වියළි බීජ වලට හානි කළ නොහැකි අතර, කැඩුණු ධාන්‍ය සහ බීජ කලලයට ඔවුන් වඩා කැමති වේ. සර්ම කලාපීය තත්ත්ව යටතේ ජීවන චක්‍රය සති 4කින් සම්පූර්ණ වේ. සුහුඹුල් කෘමීන් අවුරුදු 2 දක්වා වුව ද ජීවත් වන අතර උණුසුම් තත්ත්වයන් යටතේ පියාසර කරති. එක ගැහැනු සතෙකුට බිත්තර 600ක් දක්වා දැමිය හැකිය. සුහුඹුල් කුරුමිණියන් ඉක්මනින් ගමන් කරයි.

**දැති කුරුමිණියා (Saw –Toothed Grain Beetle)**

වැඩිහිටි සුහුඹුල් කුරුමිණියන් තද දුඹුරු-කළු වර්ණ ගනී. දිග මිලි මීටර් 3කි. උරහිසේ පැත්තකින් දත්/දැති සහිත රටාවක් ඇත. සුහුඹුල් කුරුමිණියන් ගබඩා කර ඇති ධාන්‍ය හරහා වේගයෙන් ගමන් කරන අතර උණුසුම් තත්ත්වයන් තුළ පියාසර කරයි. මාස කිහිපයක් ජීවත් වන ගැහැණු සතුන් ධාන්‍ය පුරා බිත්තර 300-400ක් ලිහිල් ව තැන්පත් කරයි. බිත්තර වලින් පිටවන සුදු පැහැති කීටයන් ධාන්‍ය මත පෝෂණය වන අතර බාහිරව වර්ධනය වේ. සර්ම කලාපීය තත්ත්ව යටතේ ජීවන චක්‍රය සති 4ක් තුළ සම්පූර්ණ කරයි.

**මාෂ බෝග කුරුමිණියා (Pulse Beetles)**

ගබඩා කර ඇති මාෂ බෝග වන කව්පි, මුං ඇට, බෝංචි ආදිය වලට අසාදනය වන කෘමි පළිබෝධකයන් ය. සුහුඹුල් ගැහැණු සතුන් බිත්තර 100ක් පමණ දමයි. බිත්තර වලින් මතු වන කීටයන් මාෂ බෝග මත පෝෂණය කරයි. කීට හා පිළවා සාමාන්‍යයෙන් බීජ තුළ දක්නට

ලැබේ. අලුතෙන් දැමූ බිත්තර කුඩාය, අළු පැහැය. පසුව ඒවා පැහැදිලිව පෙනෙන සුදු පැහැයට හැරේ. සුහුඹුල් මාෂ බෝග කුරුමිණියා මිලිමීටර් 3ක් පමණ වන අතර ශරීරය අර්ධ වශයෙන් පියාපත් වලින් ආවරණය වී ඇත. පිරිමි කුරුමිණියන්ගේ ස්පර්ෂක පනා හැඩැතිය. ගැහැණු කුරුමිණියන්ගේ ස්පර්ෂක කියත් දත් හැඩය. ඉදිරිපස පියාපත් ලා දුඹුරුය. පසුපස කෙළවරේ විශාල අඳුරු පැල්ලම් ඇත.



**ගබඩා සලබයා (Almond moth)**

සුහුඹුල් සලබයා දිගින් මිලි මීටර් 8-10 පමණ වේ. පියාපත් අළු පැහැති වන අතර ඒ මත අඳුරු රැළි සහිත සලකුණු ඇත. සුහුඹුල් සලබයන් ආහාර අනුභව නො කරන අතර කෙටි ආයු කාලයක් ඇත (සති දෙකක පමණ). ගැහැණු සතුන් මෙම සති දෙකක කාලය තුළ බිත්තර 300ක් පමණ ධාන්‍ය මත හෝ ඊට ආසන්නව දමයි. කීටයන් අඳුරු / ලා කහ පැහැයක් ගනී. කීටයන් ආහාර ද්‍රව්‍ය අලවා ජාල නිර්මාණය කරනු ලබයි. සර්ම කලාපීය තත්ත්වයන් යටතේ ($30C^0$ සහ 75% සාපේක්ෂ ආර්ද්‍රතාවය ජීවන චක්‍රය දින 30කින් සම්පූර්ණ වේ.)



**ඉන්දියානු ආහාර සලබයා (Indianmeal moth)**

සුහුඹුල් සලබයා දිගින් මිලි මීටර් 5-7 පමණ වේ. සුහුඹුලාගේ පියාපත් වල අළු/කළු පැහැයට සහ දුඹුරු පැහැ කොටස් ඇත. ගැහැණු සලබයා ගබඩා කළ ආහාර මත බිත්තර 200-400ක් දමයි. සියලු වර්ගවල ධාන්‍ය වර්ග, වියළි පලතුරු වලට මෙම සලබයා ආසාදනය වන අතර පිටි මෝල්, ආහාර සැකසුම් මධ්‍යස්ථාන වල ද දැකිය හැක. බිත්තර පිපිරී පිටවන කීටයන් ආහාර ද්‍රව්‍ය අලවා ජාල නිර්මාණය කරයි. සර්ම කාලාපීය තත්ත්වයන් යටතේ ජීවන චක්‍රය සති 4කින් පමණ සම්පූර්ණ වේ.



ඉහතින් දක්වා ඇති පරිදි කෘමීන් විසින් ආහාර ගබඩාකරණයේ දී සිදු කරනු ලබන හානි පිළිබඳ ව අවබෝධයක් ලැබීම මඟින් ඒවා මඟහරවා ගැනීම හෝ අවම කර ගැනීමට අවධානය යොමු කළ හැක. ඒ තුළින් පළිබෝධ ගහන ඝනත්වය ආර්ථික කඩයිම් මට්ටමට වඩා අඩුවෙන් පවත්වා ගැනීම මඟින් ගබඩාගත ධාන්‍ය ඇතුළු අනෙකුත් ආහාර ද්‍රව්‍ය වල සාර්ථක පළිබෝධ පාලනයක් පවත්වා ගත හැක.





# ලෝක ආහාර දිනය



**ඉන්දීවරී දිසානායක**
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනී
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය



පමණ දැන ආහාර අනුභවය කිරීම මෙන් ම පමණ දැන තම ආහාර පිගාන බෙදා ගැනීම ද ඔබ සතු වගකීමකි. ඔබ ඉවත දමන ආහාරය තවත් අයෙකුගේ කුසගින්න නිවීමට මහෝපකාරී වන බව තරයේ සිහි තබා ගත යුතුය.

ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට වර්තමානය දක්වා ම ආහාර මිනිසාගේ ප්‍රමුඛ මූලික අවශ්‍යතාවයකි. අතීත අල්ටමීරා ගුහාවේ සිට දුනු, ගල් මුගුරු රැගෙන සතුන් දඩයම් කළ මිනිසා වර්තමානය වන විට දියුණු තාක්ෂණය භාවිතා කරමින් ආහාර සොයා ගැනීම සඳහා හුදෙක් ම තම කය, මොලය වෙහෙසයි. එසේ වුව ද මිනිසුන්ගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ දී යම් යම් සීමා පැන නැඟීම තුළ දැඩි අර්බුදයක් පැන නගිනු ලබයි. මේ අයුරින් තම දිවි පැවැත්ම නිසියාකාරව පවත්වා ගෙන යාමට අවැසි පෝෂ්‍යදායි ආහාර නියමිත ප්‍රමාණයෙන් හෝ සම්පූර්ණ අයුරින් නොලැබීම මෙකී අර්බුදයන් නිර්මාණය වීමට බලපා තිබේ. දිළිඳු බව සමඟ දිවි ගෙවීමේ ප්‍රතිඵලයක් ලෙස බිහි වන මෙකී අර්බුදය වර්ධනය වීම පාලනය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO –Food and Agriculture Organization) මඟින් සෑම වසරකම ඔක්තෝබර් මස 16 වන දින ලෝක ආහාර දිනය (World Food Day) ලෙස නම් කොට තිබේ.

**ලෝක ආහාර දිනය බිහිවීම**

1975-1980 හංගේරියානු ගොවිජන ඉංජිනේරුවරයෙකු, හිටපු කොමියුනිස්ට් දේශපාලන නායකයෙකු සහ හංගේරියානු කෘෂිකර්ම අමාත්‍යවරයෙකු වූ ආචාර්ය පෝල් රොමේනි මහතා (Dr. Pal Romany) ලෝකයේ ආහාර සුරක්ෂිතතාවය, ජනතාවගේ පෝෂණය, කෘෂිකර්මයට තාක්ෂණ එකතු කිරීම ආදී අවශ්‍යතාවයන් ලොව රටවලට අවබෝධ කිරීමට ප්‍රයත්න දරන ලදී. ඒ අනුව 1979 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ මහ සභා වාරයේ කළ යෝජනාවක් අනුව, අංක 48/80 යටතේ මහ සභාව 1979 වර්ෂයේ සිට සෑම වසරකම ඔක්තෝබර් 16 වන දින කාලීන තේමාවක් අනුව සමාජික රටවල් ලෝක ආහාර දිනය සැමරීමට යොමු කෙරිණි. ලෝක ආහාර දිනය ජාත්‍යන්තර වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 20 වැනි සැසියේ දී එවකට හංගේරියානු කෘෂිකර්ම හා ආහාර අමාත්‍ය පෝල් රොමේනි සහ ඔහු නායකත්වය දුන් කණ්ඩායම විසින් ප්‍රශස්ථ කාර්යය භාරයක් ඉටු කළ බව සඳහන් කළ යුතුම ය.

සෑම වසරක් පාසාම එක්සත් ජාතීන් විසින් ලෝක ආහාර දිනය සඳහා තේමාවක් ප්‍රකාශයට පත් කරයි. ඒ අනුව දිළිඳු බව, කෘෂිකර්මය, ආහාර නිෂ්පාදනය, මානවයාගේ පෝෂණය, වාරි මාර්ග ආදී සිය විෂය ක්ෂේත්‍රයට අදාළව තේමාව නිර්මාණය කර කෙරේ.

**ආහාර සුරක්ෂිතතාවය**

ලොව පුරා සිටින සියලු ජනතාවට ප්‍රමාණවත් පරිදි නිසි පෝෂණයෙන් යුක්ත සෞඛ්‍යාරක්ෂිත ආහාර තිරසර ලෙස ලබා ගැනීමට ඇති හැකියාව සහතික කිරීම සරල ව ආහාර සුරක්ෂිතතාවය ලෙස හැඳින්විය හැකි ය. ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ලොව බොහෝ රටවල් මේ වන විටත් ස්වකීය අවධානය යොමු කොට ඇත. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය ලොව වෙසෙන ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව දැඩිව අවධානය යොමු කොට තිබේ.

**ආහාර නාස්තිය**

ගුණාත්මක තත්ත්වයේ ආහාර නොලැබීම සහ පූර්ණ වශයෙන් ආහාර නොලැබීමෙන් පීඩාවට පත්වන එනම්, ඌන පෝෂණයෙන් හා කුසගින්නෙන් පෙළෙන මිනිසුන් ලොව මිලියන ගණනින් වාසය කරයි. ඒ අතරින් බහුතරය අප්‍රිකාව, ආසියාව, ලතින් ඇමරිකාව සහ ඒ ආශ්‍රිත දිළිඳු රටවල් වල ජීවත් වේ. ලොව මිලියන ගණනින් කුසගින්නේ පීඩා විඳින පසුබිමක ආහාර නාස්තිය හා අපතේ යාම ද ඉතා ඉහළ මට්ටමකින් පවතී. ලෝක ආහාර නිෂ්පාදනයෙන් 1/3ක් නියඟ, සත්ත්ව හානි සහ විවිධ උපද්‍රව ආදී හේතූන් මත විනාශ වේ. එසේ ම, තවත් 1/3ක් ආහාර අපතේ හරින බවත්, අපතේ යන ආහාර ද්‍රව්‍ය ඉඩම් ගොඩ කිරීමට යොදා ගන්නා බවත් කියැ වේ. ඒ අනුව, ආහාර නිෂ්පාදන රටා මෙන් ම පරිභෝජන රටාවන් වෙනස් කිරීම, අපතේ යන ආහාර ප්‍රමාණයෙන් වුව ද ඉන්ධන නිපදවීම වැනි ඵලදායී කටයුතු සඳහා යෙදවීම වැනි දෑ ද සිදුකළ හැකි ය. මානව සමාජය පුරාම සාධාරණ ව ආහාර බෙදී නොයාම මෙන් ම ආහාර නාස්තිය ද ආචාර ධර්ම පවතින ශිෂ්ට සම්පන්න මානව සමාජයක පැවතිය යුතු ගුණාංගයන් නොවේ.

**කුසගින්න සහ දිළිඳු බව** අප්‍රිකාව, දකුණු ආසියාව, ලතින් ඇමරිකාව වැනි රටවල් සංවර්ධන වෙමින් පවතින රටවල් ලෙස හැඳින් වේ. ලොව පැවැත්ම වෙනුවෙන් ආහාර නිෂ්පාදනයේ යෙදෙන මෙම රටවල මිනිසුන්හට ආහාර නොලැබීම බරපතල ඛේදවාචකයකි. සිය නිෂ්පාදන සඳහා සරු තත්ත්වයේ බීජ නොලැබීම, ගබඩා පහසුකම් නොමැති වීම, ප්‍රවාහන ගැටලු, වෙළෙඳපොළ ගැටලු, මූල්‍ය සහ වෙළෙඳාම සම්බන්ධව පවතින විවිධ නීති ගැටලු නිසා ඔවුන්ගේ නිෂ්පාදනයන් විනාශයට පත් වේ. ඒ තුළින් ඔවුන් දිළින්දන් බවට නිරායාසයෙන්ම පත් වේ. ලොව මිලියන 820කට අධික ජනගහනයක් කුසගින්නෙන් පීඩා විඳියි. එසේ ම, කාන්තාවන් 60%ක් හා වයස අවුරුදු 5ට අඩු ළමුන් මිලියන 5කට ආසන්න සංඛ්‍යාවක් දිනපතා මන්දපෝෂණය හා සම්බන්ධ හේතු නිසා මිය යයි.



ලොව වෙසෙන සියලුම මනුෂ්‍ය වර්ගයාට පෝෂ්‍යදායි මෙන් ම සෞඛ්‍යාරක්ෂිත ආහාර ලබාදීමේ අරමුණ පෙරදැරිව වසර 2000 සැප්තැම්බර් මාසයේ දී ලෝක නායකයින් සහස්‍රයේ සංවර්ධන ඉලක්ක (Millennium Development Goals) කිහිපයක් ඇති කර ගන්නා ලදී. එහි පළමු වැන්න වූයේ රටවල් 40ක ජනතාව තමන් අනුභව කරන ආහාරපාන දෙකට බෙදා ඉන් අඩක් ආහාර නොමැති අය සඳහා පරිත්‍යාග කිරීමේ පිළිවෙතයි. මෙහි දෙවැන්න වූයේ වයස අවුරුදු 5ට අඩු කුඩා දරුවන් මන්ද පෝෂණයෙන් මුදවා ගැනීම සඳහා දෛනිකව ලෝක මට්ටමින් දරුවන් 17,000ක පමණ පිරිසක් ආරක්ෂා කර ගැනීමේ වැඩපිළිවෙළකට අවතීර්ණ වීමයි. කුසගින්න සමඟ අවියෝජනීය බැඳීමක් සහිත දිළිඳුකම පිටු දැකීම සඳහා ක්‍රියාමාර්ග රැසක් ගැනීම මෙහි දී ද සිදුවිය. 2015 සැප්තැම්බර් 30 වන විට සහශ්‍රක සංවර්ධන ඉලක්ක සඳහා වන කාලය අවසන් විය. වසර 2015 වන විට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයන් වූ රාජ්‍යයන් 193ක නියෝජිතයින් රැස් වී ඊළඟ වසර 15 තුළ දී සාක්ෂාත් කර ගත යුතු අරමුණු මොනවාදැයි සාකච්ඡා කර ගෝලීය අරමුණු 17ක් සහ ඉලක්ක 169ක් හඳුනා ගන්නා ලදී. ධරණීය හෙවත් තිරසර සංවර්ධන අරමුණු (Sustainable Development Goals (SDG) නම් වන මෙම අරමුණු 17 එක්සත් ජාතීන්ගේ සියලු සාමාජික රාජ්‍ය විසින් අනුමත කරන ලදී. තිරසර සංවර්ධන අරමුණු වලින් අපේක්ෂා කරන්නේ සහශ්‍රක සංවර්ධන ඉලක්ක වලින් ඔබ්බට ගොස් දිළිඳුභාවයේ මූලික හේතු හඳුනා ගැනීම හා සියලු ජනතාවන්ට සරිලන සංවර්ධනයක් වෙනුවෙන් වන ලොවටම පොදු වූ අවශ්‍යතාව සාක්ෂාත් කර ගැනීමයි.

**කොවිඩ් - 19 සහ ලෝක ආහාර දිනය**

2020 ඔක්තෝබර් මස 16 වන දින පැවැති ලෝක ආහාර දිනයේ තේමාව වූයේ "වවමු, පෝෂණය වෙමු තිරසරව, මතු අපේ හෙට දිනට" යන්නයි. කොරෝනා උවදුර හමුවේ ලෝකයේ ආහාර පිළිබඳව විවිධ ගැටලු මතු වන්නට විය. ආහාර මූලික මිනිස් අවශ්‍යතාවයක් වුව ද පසුගිය කාලයේ දී කොවිඩ් 19 වෛරසය විසින් මූලික මිනිස් අවශ්‍යතාවයන් ඇතැම් විටෙක යටපත් විය. ඒ අනුව අති සුඛෝපභෝගී ආහාර රටාවක් සහිත ලොව සංවර්ධිත යැයි සම්මත රටවල් වලට පවා ආහාර උග්‍ර ගැටලුවක් බවට පත් කිරීමට කොවිඩ් 19 වෛරසයට හැකියාව ලැබුණි.

මෙලෙස පවතින වත්මන් තත්ත්වය තුළ දුගීබව, කුසගින්න, මන්ද - පෝෂණය යනාදියෙ හි උග්‍ර වැඩිවීමක් දක්නට ලැබේ. එය යම් පමණකට හෝ තුරන් කිරීම සඳහා අප සියලු දෙනා අපගේ වගකීම යම් පමණකට හෝ ඉටු කිරීම මනුෂ්‍යත්වයට ලබාදෙන ගෞරවයකි. පමණ දැන ආහාර අනුභවය කිරීම මෙන් ම පමණ දැන තම ආහාර පිගාන බෙදා ගැනීම ද ඔබ සතු වගකීමකි. ඔබ නිවසේ හෝ ඔබ අවට ජීවත් වෙන පරිසරය තුළ කසල බඳුනෙහි ආහාර ගොඩ ගැසීම අපි සියලු දෙනාගේ ඇති අපරීක්ෂකාරී ජීවන පැවැත්මට මොනවට උදාහරණ සපයයි. ඔබ ඉවත දමන ආහාරය තවත් අයෙකුගේ කුසගින්න නිවීමට මහෝපකාරී වන බව තරයේ සිහි තබා ගත යුතුය. ආහාර ඉවත දැමීම සිත්පිත් ඇති මනුෂ්‍ය වර්ගයාගේ වගකීමක් නොවන බව ද මෙහිලා සඳහන් කළ යුතුම ය.

# ශ්‍රී ලංකාවේ දේශීය අල වර්ග

**සංරක්ෂණය කර ඇති අල වර්ග**

| | | | |
|---|---|---|---|
| 01 | උඩල | 28 | කදල |
| 02 | රාජ අල | 29 | කොහිල |
| 03 | බතල | 30 | පණු අල |
| 04 | ඇඹිලි අල | 31 | අතු අල |
| 05 | මඤ්ඤොක්කා | 32 | තුන්මස් (රෝස) අල |
| 06 | ගහල | 33 | තුන්මස් (සුදු)අල |
| 07 | කටු කුකුලල | 34 | නාට්ටල |
| 08 | කහ අල | 35 | පිට්ටු අල |
| 09 | කිඩාරන් | 36 | ආටිචොක් |
| 10 | ගෝනල | 37 | පාන්තරා අල |
| 11 | කහට අල | 38 | යකු අල |
| 12 | කිරි වැල් අල | 39 | කොළ හබරල |
| 13 | රටල | 40 | රූල් බුරුල්ලා |
| 14 | කටු අල | 42 | බිනර |
| 15 | කොළ කහ අල | 43 | කාබෙරි අල |
| 16 | හිගුරල | 44 | වැලි අල |
| 17 | ලේන දන්දීල | 45 | කිරිංගල |
| 18 | සිරුවල්ලී | 46 | සව්කෙන්ද |
| 19 | රත්න අල | 47 | බොල බූත්සරණ |
| 20 | රැවුලල | 48 | දේගාල |
| 21 | කොඩොල් අල | 49 | සුදු බූත්සරණ |
| 22 | දන්දීල අල | 50 | ඉන්අල |
| 23 | ලොකු බතල | 51 | කලු අල |
| 24 | රතු බතල | 52 | දෙමස් අල |
| 25 | කහ බතල | 53 | නිල්කිඩාරම් |
| 26 | සුදු බතල | 54 | ගොම අල |
| 27 | දෙහි අල | 55 | හුලංකීරිය |

**සංරක්ෂණය කළ යුතු අල වර්ග**

| | | | |
|---|---|---|---|
| 01 | ජාවා අල | 15 | කහ මඤ්ඤොක්කා |
| 02 | හබරල | 16 | ඉබුල් අල |
| 03 | හිරිතල | 17 | ඕවිටි අල |
| 04 | කම්බුකොඩොල් | 18 | ගොරොක්අල |
| 05 | කිරි කොඩොල් | 19 | ගොටු අල |
| 06 | රතු කොඩොල් | 20 | කිරි හිඹුරල |
| 07 | සුදු අල | 21 | බූත්සරණ |
| 08 | කිරිහබරල | 22 | කිරි අල |
| 09 | පේරාදෙණිය මඤ්ඤොක්කා | 23 | කොකිස් අල |
| 10 | රතු මඤ්ඤොක්කා | 24 | හොඩල |
| 11 | රතු අල | 25 | කිරි පබ්බල |
| 12 | සීනි අල | 26 | සීනි කෙහෙල් අල |
| 13 | බෙලි බතල | 27 | කණ්ඩල |
| 14 | සුදු මඤ්ඤොක්කා | 28 | හාරමස් අල |

# සේවා ස්ථාන වල කොවිඩ්-19 ව්‍යාප්තිය වැළක්වීමට පෙර සූදානම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශය

## පොදු මාර්ගෝපදේශය

**කොවිඩ්-19 සම්ප්‍රේෂණය වීම පහත සඳහන් ක්‍රම මගින් සිදුවිය හැකිය**

- රෝගී පුද්ගලයකු සමග ඍජු සබඳතාවයක් පැවැත්වීම මගින් (සිප වැළඳ ගැනීම) පුද්ගලයකුගෙන් පුද්ගලයකුට රෝගය බෝවිය හැක. වෛරසය නාසය, ඇස් හෝ මුඛ මාර්ගයෙන් ශරීරයට ඇතුල් විය හැක.
- අසාදිත පුද්ගලයකු කහින විට, කිවිසුම් යැවීමේදී හෝ ප්‍රශ්වාස කරන විට, නිපදවන අසාදිත කෙල බිඳිති අවට ඇති ද්‍රව්‍ය සහ පෘෂ්ඨ මත පතිත විය හැක.නිරෝගී පුද්ගලයකු අසාදිත කෙල බිඳිති සහිත පෘෂ්ඨයක් ඇල්ලීමෙන් පසු, තම ඇස් , නාසය හෝ මුඛය ඇල්ලීමෙන් වෛරසය ශරීරයට ඇතුල් විය හැක.

**පහත සඳහන් කාණ්ඩවල සේවකයින් සේවය සඳහා වාර්තා නොකල යුතුය**

- උණ සහිතව හෝ නොමැතිව කැස්ස, නාසයෙන් සොටු දියර ගැලීම, උගුරේ අසාදනය සහ හුස්ම ගැනීමේ අපහසුතාව ආදී ත්‍රීව්‍ර (කෙටි කාලීනව ඇති වූ) ශ්වසන රෝග ලක්ෂණ ඇති පුද්ගලයින්
- නව කොරෝනා අසාදනයට ඇති අවදානම හේතුවෙන් නිරෝධායනය වෙමින් සිටින පුද්ගලයින්. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් නිරෝධායනය අවසන් කල බවට ලබා දෙන සහතිකය සහිතව ඔවුන්ට නැවත සේවයට වාර්තා කල හැක.

කොවිඩ් -19 ආසාදිත බවට සැක සහිත සේවකයෙක් හමුවූ විට රෝහලට යොමු කරන තෙක් රඳවා තබා ගැනීම සඳහා සේවා ස්ථානයේ වැසිකිලි පහසුකම් සහිත වෙන් කල කාමරයක් කල්තියා හඳුනා ගත යුතුය.

**මතුපිට පිරිසිදු කිරීම හා විෂබීජහරණය කිරීම**

- නිතිපතා සිදුකරන පවිත්‍රතා කටයුතු එනම් පිසදැමීම, පිරිසිදු කිරීම සහ සේවා ස්ථානයේ ඇති පෘෂ්ඨ, උපකරණ සහ අනෙකුත් දෑ විෂබීජහරණය කිරීම අඛණ්ඩව සිදුකල යුතුය.
- සියලුම පෘෂ්ඨ සබන් සහ ජලය හෝ සාමාන්‍ය පිරිසිදු කාරක යොදා තෙත රෙදි කඩකින් පිසදැමීම කල යුතුයි.
- ඉන් අනතුරුව,
    - ලෝහ පෘෂ්ඨ 70% මද්‍යසාර අඩංගු ද්‍රාවණයකින් විෂබීජහරණය කල යුතුය.
    - ලෝහ නොවන පෘෂ්ඨ 0.1% සෝඩියම් හයිපොක්ලෝරයිට් (Sodium Hypochlorite) යොදා විෂබීජහරණය කල යුතුය.

විෂබිජහරණ කුටි භාවිතය නිර්දේශ නොකෙරේ.

**පහත සඳහන් කරුණු පිළිපැදීමෙන් යහපත් පුද්ගලික සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පවත්වා ගත යුතුයි.**

- සමබර ආහාර වේලක් ලබා ගැනීම
- ප්‍රමාණවත් තරම් පිරිසිදු ජලය පානය කිරීම
- නිතිපතා ශාරීරික ව්‍යායාම් වල නිරත වීම
- දුම්පානය සහ මත්පැන් පානය කිරීම වැනි සෞඛ්‍ය සම්පන්න නොවන පුරුදු වලින් වැළකීම

**දෑත් සනීපාරක්ෂාව පවත්වා ගැනීම**

- සේවා පරිශ්‍රයට ඇතුළු වීමට පෙර සැම අයෙක්ම අවම වශයෙන් තත්පර 20ක් වත් සබන් යොදා අත් සේදිය යුතුය. (පාදයෙන් ක්‍රියාත්මක කල හැකි වතුර කරාමයක් මේ සඳහා වඩාත් සුදුසු වේ). විකල්පයක් ලෙස මද්‍යසාර අඩංගු (මද්‍යසාර 70% v/v ) දෑත් පිරිසුදු කාරක භාවිතා කල හැකිය.
- ඉහත සඳහන් පරිදි අත් සේදීම හෝ දෑත් සනීපාරක්ෂාව
    - මුඛ ආවරණය පැළඳීමට පෙර
    - මුඛ ආවරණය ඉවත් කිරීමට පෙර
    - මුඛ ආවරණය හෝ අත් වැසුම් ඉවත් කිරීමෙන් පසු
    - ආහාර ගැනීමට පෙර සහ පසු
    - වැසිකිළි භාවිතයෙන් පසු සිදු කල යුතුය.

වැඩිදුර තොරතුරු සඳහා

- සෞඛ්‍ය අමාත්‍යංශයේ පාරිසරික සෞඛ්‍ය, වෘත්තීය සෞඛ්‍ය සහ ආහාර සුරක්ෂිතතාව පිලිබඳ අධ්‍යක්ෂ කාර්යාලය විසින් අප්‍රේල් මස 27 දින අතුරු මාර්ගෝපදේශයක් ලෙස නිකුත් කල **"නව කොරෝනා වෛරස (COVID-19) රෝගයට පෙර සූදානම සහ ප්‍රතිචාර දැක්වීම පිලිබඳ ආයතන සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශය "**
- සෞඛ්‍ය අමාත්‍යංශයේ වෙබ් අඩවිය - www.health.gov.lk
- තම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (විස්තර ලේඛනය මෙහෙයුම් මාර්ගෝපදේශයේ අමුණා ඇත)
- සෞඛ්‍ය අමාත්‍යංශයේ වසංගත රෝග විද්‍යා ඒකකය - http://www.epid.gov.lk
- මානසික සෞඛ්‍ය උපදේශන සේවය 1926 (ජාතික මානසික සෞඛ්‍ය විද්‍යාතනය), 1999 (සුවසැරිය-සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය)